**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2023**

**----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (“මණ්ඩලය”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය **අධීක්ෂණය කිරීම** සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් සිදු වන ආකාරයට පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් නියෝජනය කරන්නේද යන්න අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද සත්‍යාපන වාර්තාවට අනුව රු. මිලියන 720 ක සමස්ථ වටිනාකමක් සහිත පිරිවැය මධ්‍යස්ථාන අටක ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීමට නොහැකිව තිබූ අතර භෞතිකව නොපැවතුණි. තවද, ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානවල ඇති රු. මිලියන 999 ක් වටිනා වත්කම් පැහැදිලිව හඳුනාගත නොහැකි වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී එම වත්කම්වල ක්ෂය වීම් සඳහා රු. මිලියන 33 ක ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි. | මෙම වත්කම් විවිධ ස්ථානවලට මාරු කර ඇති බැවින් බොහෝ අවස්ථාවලදී ඒවා සත්‍යාපනය නොවේ. ඒවා භෞතිකව තිබුණද සමහර අවස්ථාවලදී සත්‍යාපන කම්ටුවලට ඒවා සත්‍යාපනය කිරීමට නොහැකි විය. ඒ අනුව, මණ්ඩලය විසින් ඒවා භාවිතා කර ඇති බැවින් එම වත්කම්වල ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් නිවැරදි වේ. භාවිතා කළ නොහැකි වත්කම් සඳහා, ඒවා අනාගතයේදී අපහරණය කරනු ලබන අතර වෙන්කර ඇති ක්ෂයවීම් සඳහා ගැලපීම් කරනු ඇත. | අයථා පරිහරණය සහ අස්ථානගතවීම් වළක්වා ගැනීම සඳහා වත්කම් කළමනාකරණය කිරීමට කළමනාකාරීත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වත්කම් වර්ගීකරණයට අදාළ අභ්‍යන්තර පාලනයන්හි දුර්වලතා හේතුවෙන් 2012 වර්ෂයේ සිට සෑම වසරකම වත්කම් හා ක්ෂයවීම් සඳහා පෙර වර්ෂයේ ගැලපීම් සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ ආරම්භක රඳවාගත් ඉපැයීම් රු. මිලියන 2,584 කින් වෙනස් කර තිබුණු අතර විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇති පෙර වර්ෂවල ලාභය, එම මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට වැරදි තොරතුරු ලබා දෙමින් ප්‍රමාණාත්මක ලෙස වෙනස් කර තිබුණි. | එල්.කේ.ඒ.එස් 8 ට අනුව පූර්ව කාල පරිච්ඡේද වැරදි නිවැරදි කිරීම නියාමන අවශ්‍යතාවයකි. ගනුදෙනුවල සංකීර්ණත්වය සහ වත්කම් පදනම රු. බිලියන 477 කින් සමන්විත වීම හේතුවෙන්, වර්ෂයෙන් පසුව ගැලපීම් සිදු කිරීමට සිදුවනු ඇත. එබැවින්, මණ්ඩලය එකී අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇත. | පෙර වර්ෂයේ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවලට සැලකිය යුතු වෙනස්කම් ඇති කර ඇති බැවින් පෙර වර්ෂයේ ගැලපීම් අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 20) විධිවිධානවලට පටහැනිව, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 26 කට අදාළව එකතුව රු. මිලියන 7,004 ක සහ එක් ව්‍යාපෘතියකට අදාළව රු. මිලියන 334 ක විදේශ ප්‍රදාන ශේෂයන් පිළිවෙලින් වසර 15 කට සහ වසර 12 කට වැඩි කාලයක් තිස්සේ ක්‍රමක්ෂය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල පැවතී බව අනාවරණය විය. තවද, ව්‍යාපෘති සඳහා ලද රු. මිලියන 42,267 ක් වූ රජයේ ප්‍රදාන, විදේශ ප්‍රදාන සහ දේශීය ප්‍රදාන වසර තුනකට වැඩි කාලයක් තිස්සේ ක්‍රමක්ෂය කිරීමකින් තොරව පැවතී අතර විගණනයට තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | ඉඩම් ඇතුළු ක්ෂය නොකළ වත්කම්වලට අදාළ ප්‍රදාන කාල සීමාව පුරාම ක්ෂය නොවී පැවතුනි. එසේම, පවතින ගොඩනැගිලිවල ආයු කාලය වසර 50 ඉක්මවයි. එවැනි කාල සීමාවක් දක්වා අදාළ ප්‍රදාන ක්‍රමක්ෂය කර ඇත.<br>ඉදිරියේදී අදාළ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවල විධිවිධානවලට අනුකූලව ලද විදේශ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතු අතර එම ප්‍රදානයට අදාළ නිශ්චිත වත්කම් හඳුනාගනිමින් ප්‍රදාන ක්‍රමක්ෂය ඇතුළු විස්තරාත්මක උපලේඛණ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සැමට ජලය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රු. මිලියන 5,294 ක් වූ ලද මුළු ප්‍රදානයෙන් ප්‍රමාද ගාස්තු වශයෙන් දරන ලද රු. මිලියන 1,378 ක්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 4.3 හි වගන්තියට පටහැනිව එම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයට එරෙහිව කපා හැර තිබුණි. තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස්) 39 වන වගන්තියේ අවශ්‍යතාවයට අනුව එය නිසි ලෙස අනාවරණය කර නොතිබුණි. | ප්‍රමාද ගාස්තු ගෙවීමට භාණ්ඩාගාරයෙන් ලද මුදල් ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇත. ප්‍රමාද ගාස්තු ගෙවීම ප්‍රාග්ධනිත කිරීම ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවේ. මෙම ගැටලුව නිවැරදි කිරීම සඳහා සැමට ජලය ව්‍යාපෘතියට අදාළ ප්‍රමාද ගාස්තු මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයට එරෙහිව හිලව් කර තිබුණි. | අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතුය. |
| (ආ) | දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 16) 51 වන වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් කාණ්ඩ 16 කට අයත් වටිනාකම රු.බිලියන 3.67 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල එලදායී ජීවිත කාලය ගැලපීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. | එල්.කේ.ඒ.එස් 16 හි 51 වන ඡේදයට අනුව, රට පුරා විසිරී ඇති අතිවිශාල වත්කම් පදනම හේතුවෙන් මණ්ඩලයේ වත්කම් පදනම තක්සේරු කිරීම ප්‍රායෝගික නොවන අතර මණ්ඩලයට විශේෂිත වූ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් පවතී. එබැවින්, වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට රජයේ තක්සේරුකරුගේ සේවය ලබා ගැනීම අපහසු වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය, එල්.කේ.ඒ.එස් 16 හි අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික වීම. |

| | | | |
|---|---|---|---|
| | | කෙසේ වෙතත්, 2023 වර්ෂයේදී පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමස්ත මෝටර් රථ පන්තියම නැවත තක්සේරු කිරීමට තීරණය කර ඇත. | |
| (ඇ) | මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (එස්.එල්.එෆ්.ආර්.එස් 09) 5.5 වගන්තියට අනුව අපේක්ෂිත ණය අලාභ හඳුනා ගැනීමෙන් තොරව, ජලාපවහන ණය ගැතියන් සහ අනෙකුත් ණය ගැතියන් සඳහා ස්ථාවර අනුපාතයක් මත පදනම්ව 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 47 ක හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි. | මෙය වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් සියයට 4.3 ක් නියෝජනය කරන අතර මෙම ශේෂයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත. එබැවින්, එස්.එල්.එෆ්.ආර්.එස් 9 හි අපේක්ෂිත ණය පාඩු ක්‍රමය අනුව වන ගිණුම්කරණ ක්‍රමවේදය මෙම ශේෂයට සැලකිය යුතු වෙනසක් සිදු නොකරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය, එස්.එල්.එෆ්.ආර්.එස් 09 සමඟ අනුකූල වන බවට සහතික වීම. |
| (ඈ) | අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 38) 118 වැනි ඡේදයට අනුව, රු. මිලියන 27.73 ක් වූ අස්පෘශ්‍ය වත්කම්වලට අදාළව කාල පරිච්ඡේදය ආරම්භයේ සහ අවසානයේ දළ ධාරණ අගය සහ සමුච්චිත ක්‍රමක්ෂය වැනි අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශනවලට සිදු කර නොතිබුණි. තවද, අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 38) 104 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මුළු අස්පෘශ්‍ය වත්කම් මුළු වත්කම්වලින් සියයට 0.0029 ක් නියෝජනය කරයි. එබැවින්, සෑම වසරකම එය සමාලෝචනය කිරීම අවශ්‍ය නොවේ. එල්.කේ.ඒ.එස් 38 හි 74 ඡේදයට අනුව, මණ්ඩලය විසින් අස්පෘශ්‍ය වත්කම් ගිණුම්ගත කිරීම සඳහා පිරිවැය ආකෘතිය භාවිතා කරයි. එබැවින්, ක්‍රමක්ෂය කිරීමේ කාලසීමාව සමාලෝචනය කිරීම අවශ්‍ය නොවේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය, එල්.කේ.ඒ.එස් 38 ට අනුකූල වන බව සහතික වීම සහ සුළු වටිනාකමක් පවා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය මෙම ප්‍රමිතිය වළක්වා නොමැත. |
| (ඉ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (එස්.එල්.එෆ්.ආර්.එස් 16) 51 වැනි වගන්තියේ අවශ්‍යතාවයට අනුව භාවිත අයිතිය සතු වත්කම් ලෙස අනාවරණය කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළ සින්නක්කර ඉඩම් යටතේ කල්බදු ඉඩම ලෙස රු. මිලියන 670 ක් වටිනා කල්බදු වත්කම් අනාවරණය කර තිබුණි. තවද, කල්බදු කාල සීමාව තුළ භාවිත අයිතිය සතු වත්කම්වල ක්ෂයවීම් මණ්ඩලය විසින් ගිණුම්ගත කර නොතිබූ අතර සාක්ෂි නොමැති වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ක්ෂයවීම්වලට එමගින් සිදු කර ඇති බලපෑම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | එස්.එල්.එෆ්.ආර්.එස් 16, කල්බදු ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුව කල්බදු ඉඩම් භාවිත අයිතිය සහිත වත්කම් ලෙස හෙළිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතාවයට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ලබාගත් ණය, මණ්ඩලයේ මුළු වගකීම්වලින් සියයට 75 ක් නියෝජනය කළද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 01) අවම අවශ්‍යතාවයට අනුකූල වන පරිදි ණය සම්බන්ධයෙන් අවශ්‍ය අවම තොරතුරු පමණක් අනාවරණය කර තිබුණි. කෙසේ වෙතත්, පරිශීලක අවබෝධය සඳහා අවශ්‍ය අනෙකුත් තොරතුරු අනාවරණය කර නොතිබුණි. | මණ්ඩලයේ පසුගිය පරිචය අනුව, දැනටමත් ණය විස්තර ලබා දී ඇත. විමසුමෙන් විස්තර කර ඇති පරිදි වැඩිදුර විස්තර 2024 අවසන් ගිණුම් වලදී හෙළිදරව් කරනු ඇත. ඒ අනුව, අවශ්‍ය වැඩිදුර තොරතුරු සපයනු ඇත. | පරිශීලකයින්ගේ තීරණ ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීම. |
| (උ) | රජයෙන් ලබාගත් රු. මිලියන 8,717 ක අතිරේක (Subsidiary) ණය මුදල පරිශීලකයින්ගේ අවබෝධය සඳහා නිසි ලෙස වර්ගීකරණය කර නොතිබූ අතර, අතිරේක ණය ගිවිසුමක් තිබියදීත් යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය මුදලද අතිරේක ණයක් ලෙස වර්ගීකරණය කිරීම වෙනුවට ඍජු ණයක් ලෙස වර්ගීකරණය කර තිබුණි. ණය අංක 3348 දරන ණය සම්බන්ධයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ ජනරජ ගිණුම්වල දැක්වෙන ශේෂයන් අතර රු. මිලියන 4,274 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය රජය විසින් ලබාගත් ණයක් වන අතර එය ජනරජ ගිණුම්වල සටහන් කර ඇත. විදේශ ප්‍රදානවල ගනුදෙනු පදනම මත මේවා මණ්ඩලයෙහි ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇත. | පරිශීලකයින්ගේ තීරණ ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීම. |
| (ඌ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 12) අවශ්‍යතාවයට අනුව වර්තමාන වර්ෂයේ ආදායම් බදු වියදම (ආදායම) පෙර වර්ෂය හා සැසඳීමේ තොරතුරු මණ්ඩලය විසින් අනාවරණය කර නොතිබුණි. | 2022/2023 බදු වර්ෂයේ බදු ප්‍රකාශන අනුව, සමුච්චිත බදු අලාභය හේතුවෙන්, 2022.12.31 සහ 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා බදු වියදම් හඳුනාගෙන නොමැත. ඒ අනුව, සැසඳීම් සහ හෙළිදරව් කිරීම් අවසන් ගිණුම්වලට ඇතුළත් නොවේ. | මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| (එ) | අදාළ වර්ෂවල නැවත අය කළ හැකි කාර්යයන් වලින් ලද ලාභය ලෙස හඳුනා ගැනීම වෙනුවට පසුගිය වර්ෂවල පාරිභෝගිකයින් විසින් ලබා දී ඇති නැවත අය කළ හැකි අත්තිකාරම් රු. මිලියන 2,597 ක් වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ ලෙස වර්තමාන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයට අය කර තිබුණි. මෙම නැවත අය කළ හැකි කාර්යයන් සඳහා අදාළ වන වියදම් අදාළ පෙර වර්ෂවල ආදායම් ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එක් එක් කොන්ත්‍රාත් ගිවිසුමේ ඇතුළත් විවිධ කොන්ත්‍රාත් කොන්දේසි හේතුවෙන්, වියදම් දරන දින සිට ව්‍යාපෘති සම්පූර්ණ කිරීම ප්‍රමාද විය හැක. නැවත අය කළ හැකි පාරිභෝගිකයා වෙත අවදානම් සහ ප්‍රතිලාභ මාරු වන අවස්ථාවේදී එනම් සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කරන අවස්ථාවේදී ලාභ හඳුනා ගෙන ඇත. සම්පූර්ණ කළ බවට හඳුනා ගත් වර්ෂය තුළදී ආදායම් ප්‍රකාශනය වෙත මාරු කර ඇත. | වගකිවයුතු නිලධාරීන් විසින් ව්‍යාපෘතිය අවසන් කරන අවස්ථාවේදී සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කිරීමට සහ ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 37) 86 වන වගන්තියේ අවශ්‍යතාවයට අනුව 2019 සිට 2022 දක්වා නිල්වලා ලවණ බාධකය ඉදිකිරීම හේතුවෙන් ජලයෙන් යටවීමෙන් හානියට පත් ගොවීන් සඳහා වන්දි තීරණය කිරීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් විසින් පත් කරන ලද කමිටුව විසින් නිර්දේශ කරන ලද රු. මිලියන 1,208 ක් වූ වන්දි වගකීම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමේ සම්භාවිතාවක් නොමැති නිසා සහ නිසි ලෙස මැනිය නොහැකි නිසා මාතර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුව විසින් නිර්දේශ කරන ලද වන්දි වගකීම් ගිණුම්වලට ඇතුළත් කර නොමැත.<br>කිසියම් නෛතික ගැටලුවක් පවතී නම් එය හඳුනාගෙන අසම්භාව්‍ය වගකීම්වල හෙළිදරව් කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල 3.2.1 වගන්තියට අනුව, රු. මිලියන 1,106 ක් වූ සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද, තොග සත්‍යාපනයේ දී තොග වර්ගීකරණයේ ස්වභාවය හඳුනා ගැනීමට ක්‍රියා පටිපාටියක් සකස් කර නොතිබුණි. | අයිතම චලනය නොවනවා ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා ගනු ලබන නිර්ණායක මත පදනම්ව, මෙම අයිතම සියල්ල අඛණ්ඩව වසර තුනක කාලයක් තිස්සේ චලනය නොවන ලෙස සටහන් වී ඇති බව පැවසිය නොහැක. එබැවින්, එම චලනය නොවන තොග සඳහා ශුද්ධ උපලබ්ධි අගය තක්සේරු කිරීම අවශ්‍ය නොවේ. වර්තමානයේදී, මණ්ඩලය විසින් යල් පැන ගිය තොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සටහන් අංක 3.2.1 අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අගය කළ යුතුය. කෙසේ වෙතත්, තොග ලැබීම් සහ නිකුත් කිරීම් අතර අසාමාන්‍ය මිල විචලනයන් හේතුවෙන් කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ලබාගත් තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුකූල නොවන බව නියදි විගණන පරීක්ෂණයෙන් | තොග කළමනාකරණ පද්ධතිය (අයිඑම්එස්) හරහා සමස්ත දිවයිනම සමස්තයක් ලෙස ගෙන එක් එක් අයිතමය සඳහා හරිත සාමාන්‍ය පිරිවැය ගණනය කර ඇත.<br><br>ලෙජරය සහ තොග සත්‍යාපනය මඟින් දීප ව්‍යාප්ත මුළු මිල | අසාමාන්‍ය මිල විචලනයන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනාවරණය වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී තොග ගැලපුම් ලෙස තොග වටිනාකමින් රු. මිලියන 200 ක් වූ අසාමාන්‍ය මිල විචලනයන් අඩු කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල තොග ශේෂයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | විචලනය, මණ්ඩලයහි භෞතිකව සත්‍යාපනය කළ මුළු තොග ශේෂයෙන් ආසන්න වශයෙන් සියයට 1 කට වඩා අඩු බව නිරීක්ෂණය වේ. යෝජිත අයිඑම්එස් හි වර්ධනයන් ක්‍රියාත්මක කිරීමත් සමඟ අනාගතයේදී මිල විචලනය ඉතා අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | |
| (ආ) | බැංකුවලින් ලද තහවුරු කිරීම් හා සසඳන විට, විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති දෙකක සහ දේශීය අරමුදල් සපයන ව්‍යාපෘති තුනක ණය සඳහා උපචිත පොලිය සම්බන්ධයෙන්, මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 1,195 ක අධිවෙන්කිරීමක් සිදු කර ඇති බව විගණනයේදී අනාවරණය විය. එබැවින්, කෙරීගෙන යන වැඩ ශේෂය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | රජය විසින් ලබාගෙන ඇති විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු අවසාන පොලී ගෙවීම් හෝ ආපසු ගෙවීම් තීරණය කරනු ඇත. එබැවින්, පොලිය ඒ අනුව ගැලපීම් කරනු ඇත. | හොඳම ඇස්තමේන්තු මත ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (ඇ) | ලද තොරතුරුවලට අනුව, පිරිවැය රු. මිලියන 25,697 ක් වූ නිම කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හැට අටක් (68) 2023 දෙසැම්බර් 31 වන දිනට ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. එබැවින්, වර්ෂයට අදාළ දේපල, පිරියත සහ උපකරණ එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී එවැනි වත්කම්වල ක්ෂයවීම් ගණනය කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීම සාමාන්‍යයෙන් කොටසින් කොටස ක්‍රියාත්මක වන අතර විවිධ අදියරවලදී සම්පූර්ණ කිරීම සඳහා අගයකිරීම සහ අනුමැතිය ලබා ගත යුතුය. මෙම ව්‍යාපෘතිවල බොහොමයක් තවමත් ඉහත ක්‍රියාවලියේ පවතී. අදාළ ව්‍යාපෘති යටතේ කිසියම් වත්කමක් සම්පූර්ණ කර භාවිත කළ හැකි තත්ත්වයක තිබේ නම් ප්‍රාග්ධනිත කරන ලෙස අදාළ ගණකාධිකාරීවරුන්ට දැනුම් දී ඇත. | ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |
| | තවද, මෙම කාරණය පෙර වර්ෂවල සිට නැවත නැවතත් අවධාරණය කර තිබියදීත් හේතු හඳුනා ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට පරීක්ෂණයක් සිදු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති ව්‍යාපෘති 05 ට අදාළ එකතුව රු. මිලියන 199 ක් වූ ශේෂයන් වසර දහතුනකට වැඩි කාලයක් තිස්සේ නොවෙනස්ව පැවතුණි. හානිකරණ බලපෑම හඳුනා ගැනීම සඳහා කිසිදු හානිකරණ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | | කිසියම් හානිකරණ පරීක්ෂාවක් සිදු කර ප්‍රතිපාදන සැලසීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වත්කම් සහ වගකීම් පිළිවෙලින් රු. මිලියන 150 ක් සහ රු. මිලියන 51 ක් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් නොවන වත්කම් සහ මෙහෙයුම් නොවන වගකීම් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ පවතී. කෙසේවෙතත්, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, හඳුනා නොගත් පෙර වර්ෂයේ රු. මිලියන 235 ක ශේෂයක්, රු. මිලියන 22 ක තොග ශේෂයක්, රු. මිලියන 8 ක බැංකු ශේෂයක් සහ අමාත්‍යාංශයට ලබා දී ඇති රු. මිලියන 15 ක අත්තිකාරමක් මෙහෙයුම් නොවන වත්කම් ලෙස ඉහත ශේෂයට ඇතුළත් කර තිබුණි. | හස්ත ක්‍රමය පරිගණක ගත කිරීම හේතුවෙන්, 1999 වර්ෂයේ සිට මෙම ශේෂයන් නැවත නැවත ඇතුළත්ව තිබුණි. ඉහත ශේෂ නිරවුල් කිරීම සඳහා විශේෂ කමිටු සැකසීම, පිළිගත් විගණන ආයතනවල සේවාවන් වැනි විවිධ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. උපකාරක ලියකියවිලි නොමැතිකම හේතුවෙන් ශේෂයන් නිරවුල් කළ නොමැත. රු.මිලියන 149 ක වගකීම් අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් පසුව ආදායම් සහ වියදම් වෙත මාරු කරනු ඇත. මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින අතර 2024 වර්ෂයේදී නිරවුල් කරනු ඇත. | පවතින ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු අතර අනාගතයේදී නිරවුල් නොකළ ශේෂයන් ඇතිවීම වැළැක්වීමට ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඉ) | පිරිවැය මධ්‍යස්ථානවල වත්කම් ලේඛනවල සටහන්ව තිබූ ඉඩම් හතරක් සහ වාහන දෙකක් එම වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර බස්නාහිර දකුණ ප්‍රදේශයට අයත් ඉඩම් තුනක් ගිණුම්ගත කර හෝ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | පශ්චාත් ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර හැකි ඉක්මනින් පශ්චාත් සත්‍යාපන වාර්තාවට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් හඳුනාගැනීමේ දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට නව සම්බන්ධතා ණය ගැතියන් ඇතුළු වෙළඳ ණය ගැතියන්ගේ ශේෂය රු. මිලියන 14,905 ක් විය. කෙසේ වෙතත්, රු. මිලියන 14,324 ක් වූ ණය ගැතියන් සඳහා පමණක් හානිකරණය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. එබැවින්, එකතුව රු. මිලියන 581 ක් වූ ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | හානිකරණය ගණනය කිරීම වාණිජ පද්ධතිය විසින් ලබා දී ඇති තථ්‍ය සංඛ්‍යා මත පදනම් විය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති ණයගැති ශේෂය, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 20 හි අනාවරණය කර ඇති ඇස්තමේන්තුගත ආදායම මත පදනම් වේ. පද්ධති දෙක (වාණිජ පද්ධතිය සහ පොදු ලෙජරය) එකිනෙකට වෙනස් අරමුණු දෙකක් සාක්ෂාත් කර ගැනීම සඳහා වින්‍යාස කර ඇත. එබැවින්, මෙම පද්ධති දෙක අතර වෙනසක් ඇත. | හානිකරණ ප්‍රතිපාදන සැලසීමේදී ලෙජරයේ ඇති සියලුම ණයගැති ශේෂයන් සැලකිල්ලට ගත යුතුය. |
| (උ) | වසර තුනකට පෙර විවිධ ව්‍යාපෘතිවලින් ලද රු. මිලියන 387 ක උපදේශන ගාස්තු ගෙවිය යුතු උපදේශන ගාස්තු ලෙස හඳුනා ගෙන තිබූ අතර එය | සපයනු ලබන උපදේශන සේවාවේ සංකීර්ණ ස්වභාවය හේතුවෙන් මෙම මුදල සඳහා | කඩිනමින් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | 2023 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර හෝ ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | සුදුසුකම් ලත් පාර්ශවයන් හඳුනා ගැනීම දුෂ්කර විය. සැසඳීම සිදු කරන තුරු මෙම ශේෂය වගකීමක් ලෙස හඳුනාගෙන ඇත. පවතින සාකච්ඡා අවසන් වූ පසු මෙම ගිණුම 2024 දී නිරවුල් කරනු ඇත. | |
| (ඌ) | 2021 වර්ෂයේදී ආයුගණක ආයතනය විසින් කරන ලද උපකල්පනය මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වත්මන් වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනය අඛණ්ඩව පවත්වා ගෙන ගොස් ඇති අතර 2023 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පිරිවැටුම, විශ්‍රාම යන වයස, වට්ටම් අනුපාතය වැනි ප්‍රජාවිද්‍යාත්මක සහ මූල්‍ය උපකල්පනවල සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. එම නිසා, පාරිතෝෂිත ප්‍රතිපාදනවල තථ්‍ය වටිනාකම සහ ගිණුම්ගත වටිනාකම සමඟ සැලකිය යුතු වෙනසක් තිබිය හැකි බව නිරීක්ෂණය විය. | පසුගිය පරිචය අනුව මණ්ඩලයේ වැටුප් සංශෝධන සෑම වසර තුනකට වරක් සැලසුම් කර ඇත. පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා ප්‍රධාන සාධකය සෑම වසර තුනකට වරක් වෙනස් වන බැවින් මණ්ඩලය විසින් සෑම වසර තුනකට වරක්ම ආයුගණක තක්සේරු කිරීම් සිදු කරයි. ඒ අනුව, 2024 දී නව ආයුගණක තක්සේරුව සිදු කෙරෙන අතර සේවක පිරිවැටුම, විශ්‍රාම යන වයස, වට්ටම් අනුපාතය සහ වැටුප් වැනි ප්‍රජාවිද්‍යාත්මක සහ මූල්‍ය උපකල්පනවල වෙනස්වීම් හේතුවෙන් සිදුවන සියලුම බලපෑම් සැලකිල්ලට ගනු ඇත. | උපකල්පනය මත සැලකිය යුතු වෙනස්කම් හේතුවෙන් ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (එ) | විකුණුම් පිරිවැය ලෙස හඳුනා ගැනීම වෙනුවට මෙහෙයුම් වත්කම්වල රු. මිලියන 6,130 ක් වූ ක්ෂයවීම් සහ එම වත්කම්වලට අදාළ ක්‍රමක්ෂය පරිපාලන වියදම් ලෙස වර්ග කර තිබුණි. | යෝජිත වත්කම් කළමනාකරණ පද්ධතියේ (ඒ.එම්.එස්) වර්ධනයන් ක්‍රියාත්මක කිරීමත් සමඟ විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී ප්‍රධාන මෙහෙයුම් වත්කම් හා සම්බන්ධ ක්ෂයවීම් හඳුනා ගැනීමට සලකා බලයි. | මෙහෙයුම්වලට ඍජුවම සම්බන්ධ වන වියදම් මෙහෙයුම් ලාභය ගණනය කිරීම සඳහා යොදා ගත යුතුය. |

### 1.5.5 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වැට් බදු වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මනුගත විකුණුම්, තොග විකුණුම්, බවුසර් සැපයුම් සහ ප්‍රධාන මෙහෙයුම්වලින් ලැබෙන ආදායම අතර රු.මිලියන 1,456 ක නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය. | දැනටමත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති සමහර ආදායම් කාණ්ඩ වැට් බදු ප්‍රකාශන සඳහා ඇතුළත් කර නොමැති අතර මෙම වෙනස්කම් සඳහා කාල වෙනස්කම් බලපා ඇත. | වෙනස්කම් සඳහා හේතු හඳුනා ගැනීමට මූල්‍ය ප්‍රකාශන, වාණිජ පද්ධතිය සහ වැට් බදු ප්‍රකාශනවල ප්‍රකාශිත ආදායමෙහි ශේෂයන් සංසන්ධනය කිරීම සහ විකුණුම් |

| | | | |
|---|---|---|---|
| | | | සංඛ්‍යාවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා විගණකවරුන් වෙත සියලු විස්තර ඉදිරිපත් කිරීම. |
| (ආ) | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සහ අදාළ ව්‍යාපෘතිවල ඒ ඒ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා සසඳන විට විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති හතරක විදේශ ප්‍රදානවල එකතුව රු. මිලියන 20,667 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් මෙම වෙනස ප්‍රධාන වශයෙන් නිර්මාණය වී ඇත. ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමෙන් පසුව මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. නමුත් ප්‍රදාන ක්‍රමක්ෂය නැවත එකතු කරමින් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සකස් කරයි. | වෙනස්කම් සඳහා සැසඳීම් සිදු කර වෙනස්කම් පවතී නම් ගැලපීම් කිරීම. |
| (ඇ) | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති හතක ඒ ඒ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප ශේෂයන් අතර එකතුව රු .මිලියන 17,333 ක වෙනසක් නිරීක්ෂණය විය. | ආණමඩුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ සටහන් කර නොමැති ඉඩම් සඳහා අත්තිකාරම් ගෙවීමේ ප්‍රතිඵලයක් ලෙස වෙනස පවතී. නමුත් ව්‍යාපෘතියේ ප්‍රකාශනවල අත්තිකාරම් ගිණුමේ (බී.ඉසෙඩ්/247) එය සටහන් කර ඇත. | වෙනස්කම් සඳහා සැසඳීම් සිදු කර වෙනස්කම් පවතී නම් ගැලපීම් කිරීම. |
| (ඈ) | ප්‍රාග්ධන දායකත්වයට අදාළව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර රු.මිලියන 10,770 ක වෙනසක් හඳුනා ගන්නා ලදී. | සැසඳීම් සකස් කර ඇති අතර හඳුනාගත් වෙනස්කම් 2024 දී නිරවුල් කරනු ඇත. | වෙනස්කම් සඳහා සැසඳීම් සිදු කර ඒ අනුව වාර්තා ගැලපීම. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ මුදල් ගිණුමේ රු. 323,782 ක නොසැසඳූ වෙනසක් නිරවුල් නොවී මාස හයකට වඩා වැඩි කාලයක් තිස්සේ පැවතුණි. | බැංකු, ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාල අතර පවතින වෙනස්කම් හේතුවෙන් මාර්ගස්ථ මුදල් ඇති වී ඇත. සැසඳීම සිදු කරමින් පවතින අතර ඒ අනුව එය නිරවුල් කරනු ඇත. | වෙනස්කම් සඳහා සැසඳීම් සිදු කර ඒ අනුව වාර්තා ගැලපීම. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වෙනත් ණයගැතියන් | 79 | ප්‍රධාන කාර්යාලය, පාරිභෝගික වත්කම් කළමනාකරණය, උතුරු කොළඹ ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානය, ත්‍රිකුණාමලය හා දෙහිවල කළමනාකරු කාර්යාලයේ අනෙකුත් ණය ගැති ශේෂයන් සඳහා පාරිභෝගිකයා අනුව විස්තරාත්මක උපලේඛණ | වයස් විශ්ලේෂණය දැනටමත් ඉදිරිපත් කර ඇත. | විස්තරාත්මක උපලේඛණ (i-xiii) විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අනෙකුත් ණය ගැතියන්, කෙටි කාලීන තැන්පතු, රඳවා ගැනීමේ බදු සඳහා විස්තරාත්මක උපලේඛණ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | චලනය නොවන සහ සෙමින් චලනය වන තොග | 1,655 | වයස් විශ්ලේෂණය | වයස් විශ්ලේෂණය දැනටමත් ඉදිරිපත් කර ඇත. | |
| (ඇ) | වෙනත් ආයතනවල කෙටි කාලීන තැන්පතු | 5 | විස්තරාත්මක උපලේඛණ සහ පැවැත්ම සඳහා හේතු | වයස් විශ්ලේෂණය දැනටමත් ඉදිරිපත් කර ඇත. | |
| (ඈ) | රඳවා ගැනීමේ බද්ද | 112 | විස්තරාත්මක උපලේඛණ සහ සහතික පත් | ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කළද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මුදල් ආපසු ගෙවීමේ හිමිකම් ඉදිරිපත් කර නොමැත. සහතිකවල පිටපත් හෝ ඉදිරිපත් කිරීම්වල උපලේඛන මෙම වර්ෂයෙදී රජයේ විගණනයට ලබා දීමට නියමිතය. | |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | පුනරුත්ථාපන බද්ද | 2 | විස්තරාත්මක බදු ගණනය කිරීම, උපලේඛන | මෙය වගකීම් ගිණුමක් වන අතර උපලේඛන ඉදිරිපත් කර ඇත. මෙම ශේෂය 1999 සිට ඉදිරියට ගෙනවිත් ඇත. මෙය මෙහෙයුම් නොවන ශේෂවලට ඇතුළත් කළ යුතුය. මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින අතර 2024 වර්ෂයේදී නිරවුල් කරනු ඇත. |
| (ඊ) | භාණ්ඩාගාර ප්‍රදාන | 137 | අදාළ ව්‍යාපෘති විස්තර සමඟ ප්‍රදානවල විස්තරාත්මක උපලේඛණ | විස්තරාත්මක උපලේඛණක් ඉදිරිපත් කර ඇත. |
| (උ) | ප්‍රාග්ධන ප්‍රදාන-පළාත් පාලන ආයතන | 544 | අදාළ ව්‍යාපෘති විස්තර සමඟ ප්‍රදානවල විස්තරාත්මක උපලේඛණ | විස්තරාත්මක උපලේඛණක් ඉදිරිපත් කර ඇත. |
| (ඌ) | විදේශ ප්‍රාග්ධන ප්‍රදාන | 7,232 | අදාළ ව්‍යාපෘති විස්තර සමඟ ප්‍රදානවල විස්තරාත්මක උපලේඛණ | විස්තරාත්මක උපලේඛණක් ඉදිරිපත් කර ඇත. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු. මිලියන 2,344.78 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, ජලාපවහන ණයගැතියන් සහ අනෙකුත් ණයගැතියන් වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි. ඉහත වෙළඳ ණය ගැතියන්ගෙන් සියයට 66 ක් බස්නාහිර මධ්‍යම, දකුණ, බස්නාහිර උතුර සහ බස්නාහිර දකුණු ප්‍රදේශ නියෝජනය කරයි. නව සම්බන්ධතා ණයගැතියන් මාස තුනක් ඇතුළත වාරික 3 කින් අයකර ගැනීමට නියමිතව තිබුණද, රු. මිලියන 32.5 ක් වසර 3 කට | හිඟ මුදල් ක්‍රමිකව වර්ධනය විය. හිඟ මුදල් අයකර ගැනීමට දැන් කටයුතු කර ඇත. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වඩා වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි. | | |
| (ආ) | අමාත්‍ය නිල නිවාස සඳහා ලබාදී ඇති ජල සම්බන්ධතා 23 ක් සම්බන්ධයෙන් රු. මිලියන 3.5 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අයකර ගැනීමකින් තොරව දීර්ඝ කාලීනව හිඟව පැවතුණි. | මියගිය මහජන නියෝජිතයන්ගෙන් අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි බව පාර්ලිමේන්තු මහලේකම්වරයා දන්වා ඇත. මහජන නියෝජිතයන්ගේ පෞද්ගලික නිවාසවලින් හිඟ මුදල් අයකර ගැනිමේදී සාමාන්‍ය පාරිභෝගිකයන් ලෙස සලකා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. ඒ අනුව, හිඟ මුදල් නොගෙවන ස්ථානවල ජල සැපයුම විසන්ධි කරන ලෙස වාණිජ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | අදාළ පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල අය කර ගැනීමට ප්‍රමාණවත් හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට හිඟ විසන්ධි කරන ලද ණය ගැතියන් රු. මිලියන 1,886.73ක් විය. එයින් සියයට 69 ට සමාන රු. මිලියන 1,293.21 ක් වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමකින් තොරව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිද්ධීන් 2464 ක් ප්‍රධාන කාර්යාලයට වාර්තා විය. 2023 වර්ෂයේදී සිද්ධීන් 1972 ක් ද අවසන් කර ඇත. ප්‍රගතියක් ඇත. අයකර ගැනීම පිළිබඳ ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානවල පුහුණු සැසි පැවැත්වේ. අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතී. | අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඈ) | ගාල්ල නගර සභාවේ වසර 20 ක සිට අයවිය යුතු නීතිවිරෝධී සම්බන්ධතා දෙකක් සම්බන්ධයෙන් රු.මිලියන 1.76 ක හිඟ ශේෂයක් සහ වසර 6 කට වඩා වැඩි කොළඹ මහ නගර සභාවට අදාළව අයවිය යුතු රු. මිලියන 28 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | ලිඛිත දැනුවත් කිරීම්වලින්, රැස්වීම් කිහිපයක් පැවැත්වීමෙන් සහ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් පසුව ගාල්ල මහ නගර සභාවේ ගිණුම් අංකවලින් හිඟ මුදල් අය කර ගෙන ඇත. තවද, කළමනාකරණ මට්ටමින් තීරණ ගත යුතුය. | අනවසර ජල සම්බන්ධතා හේතුවෙන් දරන ලද අලාභ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඉ) | ණය ගැතියන් වෙත යවන ලද තහවුරු කිරීම් විශ්ලේෂණය කිරීමේදී, 2023 අප්‍රේල් 30 වන දිනට රු. මිලියන 347 ක සමස්ථ වටිනාකමක් සහිත ගිණුම් 160 ක් අතරින් රු.මිලියන 58 ක සමස්ත වටිනාකමක් සහිත ගිණුම් 36 ක් තහවුරු වී තිබුණි. ස්ථානය සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් රු. මිලියන 2 ක වටිනාකමක් සහිත එක් ගිණුමක් ආපසු එවා තිබූ අතර රු. මිලියන 288 ක | පද්ධතියේ ඇති ලිපින භාවිතා කර ඇත. පාරිභෝගිකයන් වෙත ජල බිල්පත් සහ අනෙකුත් නිල සන්නිවේදනයන් ලබා දීමට එම ලිපිනයන් භාවිතා වේ. | මෙහෙයුම්වලදී පාරිභෝගිකයාගේ සැබෑ ලිපිනය තහවුරු කරගැනීම අවශ්‍ය වන අතර නිරීක්ෂණය කළ වෙනස්කම් වර්ගීකරණය කර හේතුව සොයා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමස්ථ වටිනාකමක් සහිත ගිණුම් 123 ක් හෙවත් සියයට 76.87 ක් ප්‍රතිචාර දක්වා නොතිබුණි. එබැවින්, ණය ගැතියන්ගෙන් බහුතරයකගේ පැවැත්ම තහවුරු කර ගත නොහැකි විය. | | |
| (ඊ) | බාහිර ආයතනවල තැන්පත් කර ඇති ආපසු ගෙවිය හැකි කෙටි කාලීන තැන්පතු එකතුව රු. මිලියන 60 ක් වසර තුනක් තිස්සේ ආපසු අයකර ගැනීමෙන් තොරව පැවතුණි. | මින් සමහර මුදල්, ආපසු ගෙවිය හැකි තැන්පතු ලෙස 2017 පෙබරවාරි මාසයේදී මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා ඇත. මෙම තැන්පතුව අයකර ගැනීම සඳහා 2022 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇතත්, මේ දක්වා පියවීමක් කර නොමැත. එබැවින්, මාර්ග සංවර්ධන අධිකාරියට කරනු ලබන ඉදිරි ගෙවීම්වලින් මෙය අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | තැන්පතු සහ අත්තිකාරම්වල පැවැත්ම සමාලෝචනය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අදාළ ඉඩම් අත්පත් කර ගෙන තිබුණද, ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානය (මධ්‍යම) විසින් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ගෙවන ලද රු. මිලියන 47 ක ඉඩම් අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින්, වත්කම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දුන් රු. මිලියන 42 ක අත්තිකාරම් ලෙජර් කේතය 246 යටතේ කොන්ත්‍රාත්කරුට ලබා දුන් අත්තිකාරම් ලෙස සටහන් කර තිබූ අතර ඒවා නිරවුල් නොකර වසර 09 කට වැඩි කාලයක් තිස්සේ පවතී. | ප්‍රාග්ධනීකරණ අදියරේදී වත්කම් ආකෘති සොයා ගැනීමට සහ වැරැද්ද නිවැරදි කිරීමට වහාම පියවර ගනු ඇත. | අත්තිකාරම් ගෙවීම් වරින් වර සමාලෝචනය කළ යුතුය. |
| (ආ) | 2023 ඔක්තෝබර් 31 වැනි දිනට අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන සක්‍රීය නොවන හිටපු සේවකයන්ට ලබාදුන් රු. මිලියන 17 ක ණය සහ අත්තිකාරම් වසර අටකට වඩා වැඩි කාලයක් තිස්සේ ගිණුම්වල පැවතුණි. කෙසේ වෙතත්, විගණනය මගින් කරන ලද නියැදි පරීක්ෂණයට අනුව, ණය සහ අත්තිකාරම් ලබාගෙන ඇති ඉහත | නියමිත ක්‍රමවේදයට අනුව විශ්‍රාම ගිය අයගෙන් මණ්ඩලයට අයවිය යුතු මුදල අයකර ගන්නා ලෙස මුදල් දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. | එම ශේෂයන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර ඒවා අයකර ගැනීමට නොහැකි නම් ලැබිය යුතු මුදල් අයකර නොගෙන සේවකයන්ට විශ්‍රාම |

| | | |
|---|---|---|
| සේවකයන්ගෙන් සියයට 90 කට වඩා වැඩි පිරිසකට, 2011 අගෝස්තු 05 දිනැති පී 12/2011 දරන අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේඛයේ අංක 03.5 ඡේදය ප්‍රකාරව නියමිත මුදල් අයකර ගැනීමෙන් තොරව විශ්‍රාම යාමට ඉඩ ලබාදී තිබුණි. | | යාමට ඉඩ දුන් සේවකයන්ට එරෙහිව පියවර ගත යුතුය. |

**1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 24) අවශ්‍යතා අනුව රු. මිලියන 4.02 ක් වූ අධ්‍යක්ෂවරුන්ගේ දීමනාව සහ රු. මිලියන 6.25 ක් වූ විශ්‍රාම පාරිතෝෂිකය වැනි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. | විශාල පාරිභෝගික සහ සැපයුම්කරුවන්ගේ පදනම හේතුවෙන්, මණ්ඩලයට විභව සම්බන්ධිත පාර්ශවයන් සමඟ සාමූහිකව සහ තනි තනිව නොවැදගත් ගනුදෙනු පවතින අතර මණ්ඩලයෙහි සාමාන්‍ය ක්‍රියාකාරකම්වලදී ඕනෑම පාර්ශ්වයක් සමඟ ගනුදෙනුවලට එළඹේ. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු සඳහා හෙළිදරව් කිරීම් ඉහත කරුණු මත සිදු කෙරේ. | ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

**1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 වන මුදල් රෙගුලාසිය | අදාළ පාර්ශව වෙත මුදා හැරීමකින් හෝ ආදායමට බැර කිරීමකින් තොරව රු. මිලියන 219 ක ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ පවතුණි. | ආපසු ගෙවිය හැකි තැන්පතු නිදහස් කිරීමේ කොන්දේසිය සපුරාලීම මත පදනම්ව, ඒ අනුව කටයුතු කරනු ඇත. | තැන්පතු ශේෂයන් කාර්තුමය වශයෙන් සමාලෝචනය කර නිවැරදි වේලාවට පියවීම. |
| (ආ) | 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 5.1 | මෙම විධිවිධානයට පටහැනිව, ඒකාබද්ධ අරමුදලට ලාභ ගෙවීමෙන් තොරව 2023 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා වෙනුවට රු. මිලියන 287.85 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ඵලදායිතා දිරි දීමනාව ලෙස ගෙවා තිබුණි. එම මුදලට අමතරව, සමාලෝචිත වර්ෂය තුළදී වැටුප සමඟ මාසික ඵලදායිතා දීමනාව ලෙස රු. මිලියන 471.39 ක් සේවකයන්ට ගෙවා තිබුණි. | ඵලදායිතා මට්ටම් වැඩි වීම අනුව ඵලදායිතා දිරිගැන්වීම් ගෙවා ඇත. ආදායම, එකතු කිරීම, එන්.ආර්.ඩබ්ලිව් යනාදී ඵලදායිතා නිර්ණායක ඇතුළත් සූත්‍රයක් අනුව මෙය ගණනය කර ඇත. උපයන ලද ලාභය සහ නිකුත් කරන ලද රජයේ චක්‍රලේඛ අනුව පමණක් | මෙහෙයුම් අත්පොතෙහි අවශ්‍යතාවයට අනුකූල වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රසාද දීමනා ගෙවනු ලබයි. ඒ අනුව ප්‍රසාද දීමනා ගෙවා නැත. | |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඡේද අංක 2.1 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමාණවත් අධීක්ෂණයකින් යුතුව ප්‍රතිපත්ති සහ මෙහෙයුම් භූමිකාවන් පැහැදිලිව වෙන් කර ඇති බව සහතික කිරීම සඳහා අවශ්‍ය පාලනයන් හඳුන්වා දීම සහ පවත්වාගෙන යාම සිදු කර යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීමෙන් තොරව සාමාන්‍යාධිකාරීවරයා විසින් ආයතනික සන්නිවේදන ශාඛාව අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාට භාර දී තිබුණි. | 2023.05.09 දිනැති පී 28/2023 චක්‍රලේඛය මත පදනම්ව, ආයතනික සන්නිවේදන අංශය අධීක්ෂණය කිරීමේ බලතල මණ්ඩලයේ සභාපතිවරයාට ලබා දී ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය බලය ලබා දී නොමැත. එබැවින්, මාර්ගෝපදේශ අවශ්‍යතාවයට අනුකූල වීම. |
| (ඈ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.2(i) වගන්තිය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 මැයි 23 දිනැති අංක ඩීඑම්එස්/ඊ2/19/4/064 දරන ලිපිය | මණ්ඩලයේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය සඳහා අනුමැතිය 2024 මාර්තු මාසය අවසන් වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි. | විශේෂඥ කමිටුවක් විසින් සකස් කරන ලද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර සම්මත ආකෘතිය සකස් කිරීම සඳහා ආපසු ලබා දී ඇත. ඉන්පසුව, යෝජිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සමාලෝචනය කරමින් පවතින අතර අවසන් කිරීම සඳහා වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කෙරේ. ඒ අනුව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය නැවත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සහ උසස් කිරීමේ ක්‍රියා පටිපාටිය සඳහා අනුමැතිය හැකි ඉක්මනින් ලබා ගත යුතුය. |
| (ඉ) | 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා | සේවකයන් සමඟ සාමූහික ගිවිසුම්වලට එළඹීමකින් තොරව 2012 වසරේ සිට අඛණ්ඩව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පමණක් සේවක වැටුප් හා ප්‍රසාද දීමනා මණ්ඩලය විසින් ගෙවා තිබුණි. | සටහන් කරගෙන ඇත. | චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය සහ 2012 ජනවාරි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය | | | |
| (ඊ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සාමාන්‍යාධිකාරීවරයාට වෙන් කර තිබූ වාහනයට 2023 අප්‍රේල් 12 වැනි දින මෙම අනතුර සිදු වුවද, එම රිය අනතුරෙන් සිදු වූ රු. මිලියන 13 ක අලාභය පිළිබඳව 2023 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවට මණ්ඩලය විසින් වාර්තා කර නොතිබුණි. | තථ්‍ය අලාභය මෙතෙක් ගණනය කර නොමැති බැවින් එය පැහැදිලිව හඳුනා ගැනීමෙන් පසුව අදාළ රියදුරුගෙන් පැහැදිලි කිරීම් කැඳවනු ලැබේ. | අලාභ අයකර නොගැනීම, අලාභ තක්සේරු කිරීමට වසරකට වැඩි කාලයක් ගත කිරීම සහ එසේම සුදුසුකම් ලත් කාල සීමාව තුළ රක්ෂණයෙන් හිමිකම් ලබා නොගැනීම සම්බන්ධයෙන් කළමනාකරණය වගකිව යුතුය. |
| (උ) | 2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ඡේද අංක 1.2 | එක් වාහනයක් වෙන් කිරීම වෙනුවට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව මණ්ඩලයේ වාහන ප්‍රතිපත්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අංක 5/15/2022-898 අනුව සභාපතිවරයාට සහ උප සභාපතිවරයාට වාහන දෙක බැගින් 2022 සහ 2023 වර්ෂවලදී වෙන් කර තිබුණි. | අවශ්‍යතාවය අනුව වාහන අදාළ අංශ වෙත වෙන් කරයි. මෙම වාහන ලේකම් අංශය වෙත වෙන් කර ඇත . | චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම සහ පවරා ඇති වාහනවලට අමතරව කරන ලද අමතර වියදම් අයකර ගැනීම. |
| (ඌ) | 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ඡේද අංක 3.2.2 | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලය තුළදී අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සඳහා ඉන්ධන ලීටර් 23,313 ක අතිරික්ත ඉන්ධන භාවිතය සඳහා මණ්ඩලය රු. මිලියන 7.4 ක් ගෙවා තිබුණි.<br>මහා භාණ්ඩාගාරයෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සහ කළමනාකරුවන් වෙත කාර්යාල | පී 19/2008 දරන අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේඛයේ දක්වා ඇති සීමාවන්ට වඩා භාවිතා කරන අමතර ඉන්ධන සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව අදාළ අධිකාරිය හරහා අනුමැතිය ලබා ගත හැක.<br>ඒ අනුව, 1990.08.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද චක්‍රලේඛය තවමත් ක්‍රියාත්මක වේ. තවද, | නිසි අනුමැතියකින් තොරව චක්‍රලේඛයේ විධිවිධාන උල්ලංඝනය නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වේලාවෙන් පසු සහ නිවාඩු දිනයන්හි පුද්ගලික පරිහරණය සඳහා කිලෝමීටරයකට රු. 2 සිට රු. 15 දක්වා සහනදායි මිලකට සීමාවකින් තොරව 1990 වර්ෂයේ සිට මණ්ඩලයේ වාහන භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා සේවකයන් 13 දෙනෙකුගේ පෞද්ගලික පරිහරණය සඳහා භාවිත කළ ඉන්ධන ලීටර් 12,010 ක් සඳහා රු. මිලියන 4 ක මණ්ඩලයේ අරමුදල් මණ්ඩලය අවභාවිත කර ඇති බව නියැදි විගණනයේ දී අනාවරණය විය. | 2024.02.28 දිනැති පීඊඩී චක්‍රලේඛ අංක 01/2024 පරිශීලනය කිරීම මගින් සාමාන්‍යාධිකාරී විසින් නිකුත් කරන ලද 2024.03.08 දිනැති අංක ජීඑම්/ඕපී දරන චක්‍රලේඛයට අනුව අතිරික්ත ඉන්ධන සීමා කරයි. | |
| (එ) | 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව මසකට ලීටර් 145 වෙනුවට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මණ්ඩලයේ සභාපති සහ උපසභාපතිවරයා විසින් 2021 ජනවාරි මස සිට අසීමිතව ඉන්ධන භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, පීඊඩී චක්‍රලේඛ අංක 01/2015 හි 3.2.1 ඡේදයට පටහැනිව, 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලය තුළදී සභාපතිවරයා විසින් භාවිතා කරන ලද රු. මිලියන 2 ක් වටිනා ලීටර් 5,806 ක් සහ උප සභාපතිවරයා විසින් භාවිතා කරන ලද රු. මිලියන 2.3 ක් වටිනා ලීටර් 6,393 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, උප සභාපතිවරයාට පවරා ඇති අංක පී.කේ 3575 දරන වාහනය 2022 සහ 2023 වර්ෂවලදී සාමාන්‍යාධිකාරීවරයාට සහ පාලන අධිකාරියට නොදන්වා බාහිර පාර්ශ්වයක් විසින් භාවිතා කර තබුණි. එම කාලය තුළදී වාහනය කිලෝමීටර් 13,698 ක් ධාවනය කර තිබුණි. | රේඛීය අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අදාළ රේඛීය අමාත්‍යවරයා විසින් 2021.11.25 දිනැති එස්/25 අංකය දරන ලිපිය මගින් එය අනුමත කර ඇත. උප සභාපතිවරයාට පවරන ලද පීකේ- 3575 දරන වාහනය අමාත්‍යාංශ නිලධාරීන් විසින් අවස්ථා කිහිපයකදී භාවිත කර ඇත. නමුත්, මණ්ඩලය විසින් ඉන්ධන වියදමක් දරා නොමැත. | චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම සහ අදාළ බලධාරීන්ගෙන් අතිරික්ත නිල භාවිතය සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම. |
| (ඒ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.11.4/5 වගන්තිය | 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 75 ක් වටිනා කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක නොකිරීමට හේතුව පිළිබඳව කොන්ත්‍රාත්කරුගෙන් පැහැදිලි කිරීමක් හෝ කොන්ත්‍රාත් අංක Sup & MM/Chem/HL-01/2021/22 යටතේ කොන්ත්‍රාත්කරුගෙන් කිසියම් ලිඛිත දැන්වීමක් ලබා ගෙන නොතිබුණි. තවද, | ලංකා බැංකුවෙහි ඩොලර් ද්‍රවශීලතාවය නොමැතිකම හේතුවෙන්, 2023/05/24 දින දක්වා ණයවර ලිපි විවෘත කිරීමට ප්‍රමාද විය. කෙසේ වෙතත්, 2023/11/04 දින ඔවුන් එම සැපයුම (මෙ.ටො 2497.8) | පීඊඩී චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | කොන්ත්‍රාත්කරුට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග නොසලකා කොන්ත්‍රාත්තුව කඩ කිරීම පිළිබඳව මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශයට දන්වා නොතිබුණි. | සම්පූර්ණ කර ඇත. | |
| (ඔ) | 2015 අගෝස්තු 12 දිනැති පාලන/ 12/2015 දරන සාමාන්‍යාධිකාරිවර යාගේ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ | 2023 දෙසැම්බර් 31 දිනට රු.50,000 ට වැඩි බිල්පත් වටිනාකමක් සහිත විසන්ධි කරන ලද ණයගැතියන් 4,448 ක් සම්බන්ධයෙන් එකතුව රු. මිලියන 695.48 ක් වන හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට චක්‍රලේඛය ප්‍රකාරව නීතිමය පියවර ගෙන නොතිබුණි. | 2023 වර්ෂය සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා පාරිභෝගික ගිණුම් 5993 ක් ප්‍රධාන කාර්යාලයට යවා ඇත. ඒ අනුව, පසුගිය වර්ෂයට වඩා ප්‍රගතියක් ලබා ඇත. නීතිමය ක්‍රියාපටිපාටියෙන් රු. මිලියන 617 ක හිඟ මුදල් අයකර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අයකර ගැනීමේ අංශය වෙත යොමු කර ඇත. මෙයින් 2023 වර්ෂයේදී රු. මිලියන 66 ක් සහ 2024 අප්‍රේල් 30 දක්වා රු. මිලියන 55 ක් අයකර ගෙන ඇත. | පීඊඩී චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූල වීම. |
| (ඕ) | 2011 ජුනි 06 දිනැති එෆ්ඩී/72 දරන සාමාන්‍යාධිකාරිවර යාගේ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ | චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුව වසරකට පෙර සැපයුම් අත්තිකාරම් ලෙස ලබා දී ඇති රු. මිලියන 1.3 ක මුදල ලබා දුන් අත්තිකාරම් දිනයේ සිට දින 14 ඉක්මවී ඇතත් අදාළ සේවකයින් විසින් පියවා නොතිබුණි. | සාමාන්‍යයෙන් සැපයුම් අත්තිකාරම් දින 14 ක් ඇතුළත අයකර ගනු ලැබේ. මෙය පරීක්ෂණයක් සිදු කරමින් පවතින විශේෂ සිද්ධියකි. දැනට පවතින විමර්ශන හේතුවෙන් මෙම අත්තිකාරම් දීම අත්හිටුවා ඇත. | පවතින ක්‍රමවේදයට අනුකූල වීම. |

**1.9** **මුදල් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පසුගිය වසර දෙක තුළ වාර්ෂික ආදායම රු. බිලියන 30 ඉක්මවා ඇතත් 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.2 ප්‍රකාරව ආයෝජන කමිටුවක් පිහිටුවා නොතිබුණි. | අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්), සහකාර සාමාන්‍යාධිකාරී (ආයතනික මූල්‍ය) සහ ප්‍රධාන ගණකාධිකාරී (ආදායම්) යන අය අතුරින් අවම වශයෙන් දෙදෙනෙකු විසින් ලේඛන අත්සන් කලද ඔවුන්ගේ උපදේශන සහ | මෙහෙයුම් අත්පොතෙහි අවශ්‍යතාවය සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සාකච්ඡාවන් මත ආයෝජන තීරණ සැම විටම ගනු ලබයි. ආයෝජන කමිටුවක් පත් කිරීම 2024 දී ක්‍රියාත්මක කෙරේ. | |

**1.10 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත - 03 වන වගන්තිය | එක් එක් මූලාශ්‍රවලින් තක්සේරු කළ හැකි ආදායම වෙන වෙනම ගණනය කර නොතිබුණි. | ඉදිරියට ගෙන එන ලද බදු අලාභ හේතුවෙන් බදු වගකීමක් හඳුනා නොගත් බැවින්, තක්සේරු කළ හැකි ආදායම ශූන්‍ය වේ. | අලාභ ලබා ඇති අවස්ථාවකදී වුවත් තක්සේරු කළ හැකි ආදායම නිවැරදිව ගණනය කළ යුතුය. |
| | - 91 වන වගන්තිය | 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම් බදු වාර්තාව 2023 අගෝස්තු 15 දිනට ඉදිරිපත් කර නොතිබුණි. | 2023/24 බදු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බදු ගණනයට අනුව, බදු වගකීමක් පැන නැගී නොමැත. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම් බදු වාර්තාව ඉදිරිපත් කර නොමැත. | බදු වගකීමක් නොමැති වුවත් නියමිත දිනට බදු වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 83 අ (1අ) වගන්තිය, 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත, 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත සහ 2022 දෙසැම්බර් 28 දිනැති අංක 2312/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 2023 වර්ෂයේ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දට (APIT) යටත් සේවානියුක්ත ආදායම ගණනය කිරීමේදී වෛද්‍ය රක්ෂණ දීමනාව, දුරකථන දීමනාව, ගමන් දීමනාව සහ සංචාරක බංගලා පහසුකම් මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි. එබැවින්, මෙම දීමනා සඳහා අදාළ බදු වගකීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා නොතිබුණි. | අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කිරීම් සඳහා වාහන දීමනා, දුරකථන දීමනා සහ නේවාසික පහසුකම් සලකා බැලීමට දැනටමත් පියවර ගෙන ඇත. | දඬ මුදල් වළක්වා ගැනීම සඳහා පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 5,286.52 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු. මිලියන 2,699.80 ක් (නැවත පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව) විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ පෙර වසරේ අලාභය අභිබවා රු. මිලියන 7,986.33 කින් ලාභයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. පසුගිය වසරට සාපේක්ෂව ආදායම සියයට 74 කින් සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් සහ ලාභ සියයට 232 කින්

වර්ධනය වීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ගාස්තු වැඩිවීමත් සමඟ මනුගත විකුණුම්, තොග සහ බවුසර් විකුණුම් සංසන්දනාත්මකව වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස දළ ලාභය පෙර වර්ෂයට වඩා සියයට 135 කින් වැඩි විය. සම්පූර්ණ කරන ලද කාර්යයන් සඳහා නැවත අය කළ හැකි අත්තිකාරම් මුදල වූ රු. මිලියන 2,597 ක් වෙනත් ආදායමට මාරු කිරීම ද මෙම හිතකර තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත. සියයට (5) සිට සියයට 404 දක්වා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධ සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එබැවින්, අයවැය කළමනාකරණ පාලනයේ ඵලදායී මෙවලමක් ලෙස භාවිත කර නොමැති බව නිරීක්ෂණය විය.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්වල විශ්ලේෂණය පහත පරිදි වේ.

| විස්තරය | විචලන වටිනාකම වැඩි වීම/ (අඩු වීම) (රු.මිලියන) 2023 | 2022 | විචලනය % | විචලනයට හේතු |
|---|---|---|---|---|
| මනුගත විකුණුම් | 57,536 | 32,533 | 77 | ගාස්තු අනුපාතයන් වැඩි වීම, දී ඇති නව ජල සම්බන්ධතා වැඩි වීම, ගෘහස්ථ පරිභෝජනය වැඩිවීම, බවුසර් ජල සැපයුම වැඩි වීම ආදිය. |
| විකුණුම් පිරිවැය | 32,844 | 23,145 | 42 | පොම්ප කිරීමේ පිරිවැය, රසායනික පිරිවැය, අලුත්වැඩියා හා නඩත්තුව, ස්ථාපිත වියදම් යනාදිය ඉහළ යාම. |
| වෙනත් මෙහෙයුම් ආදායම් හා ඉපැයීම් | 4,285 | 1,289 | 232 | නැවත අය කළ හැකි ආදායම, ජල පිළිසැකසුම් හා භූගත ජල ආදායම සහ අධිභාර, දඩ මුදල් ඇතුළු විවිධ ආදායම් වැඩි වීම. |
| පරිපාලන වියදම් | 14,841 | 14,052 | 6 | අළුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හා ස්ථාපිත වියදම්, කුලී, ගාස්තු, බදු, ආරක්ෂක වියදම් ආදිය වැඩි වීම. |
| මූල්‍ය පිරිවැය | 14,948 | 3,917 | 282 | පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී ණය ලබා ගැනීම්, සමාලෝචිත වර්ෂය තුළදී ගෙවිය යුතු වාරික වැඩි වීම සහ පොලී අනුපාත සැලකිය යුතු ලෙස වැඩි වීම. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මණ්ඩලයේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| වර්ෂය | 2023 | 2022 නැවත පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට අනුව |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 47 | 35 |
| ශුද්ධ ලාභ ආන්තිකය | 9 | (8) |
| ජංගම අනුපාතය (වාර ගණන) | 0.55 | 0.67 |
| ද්‍රවශීලතා අනුපාතය (වාර ගණන) | 0.44 | 0.57 |
| මුළු වත්කම් පිරිවැටුම (වාර ගණන) | 0.06 | 0.04 |
| ස්කන්ධයට ණය අනුපාතය | 0.44 | 0.53 |

ඉහත තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ ප්‍රධාන මූල්‍ය අනුපාත ඉකුත් වර්ෂයට සාපේක්ෂව අවාසිදායක තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලබා ගත් ණය සහ ගෙවිය යුතු ණය සඳහා ගෙවිය යුතු පොලී වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. තවද, සිදු කරන ලද ණය ආපසු ගෙවීම හේතුවෙන් මණ්ඩලයේ මුළු හිඟ ණය ශේෂය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 335 සිට රු. බිලියන 321 දක්වා හෝ සියයට 4 කින් අඩු වී ඇත. එබැවින්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ස්කන්ධයට ණය අනුපාතය සියයට 0.53 සිට 0.44 දක්වා හෝ සියයට 17 කින් අඩු වී ඇත. ප්‍රධාන වශයෙන් 2023 සැප්තැම්බර් මාසයේ සිට ගාස්තු ඉහළ දැමීම හේතුවෙන් ශුද්ධ අලාභය ඉකුත් වර්ෂයට වඩා සියයට 17 කින් අඩු වී ඇත. වත්කම් භාවිතයේ අකාර්යක්ෂමතාව පෙන්නුම් කරමින් වත්කම් පිරිවැටුම ඉතා පහළ මට්ටමක පවතී. කෙසේ වෙතත්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව වත්කම් භාවිතය සියයට 50 කින් වැඩි වීමෙන් වත්කම් භාවිතය හිතකර මට්ටමක පවතී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාක්ෂණික විශේෂඥයින්ගේ නිර්දේශ ලබා ගැනීමෙන් තොරව පානීය ජලය සඳහා ලුණු මිශ්‍ර වීම වැළැක්වීම සඳහා නිල්වලා ලවණ බාධකය ඉදිකිරීම යටතේ සවි කරන ලද ෂීට් පයිල්ස් ගොවීන්ගේ බලපෑම මත දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් මත රු. මිලියන 8 ක් වැය කර ඉවත් කර තිබුණි. තවද, පරිසර අධිකාරියේ කමිටුවක් විසින් නිකුත් කරන ලද වාර්තාවකින් ද මාතර දිස්ත්‍රික්කය ජලයෙන් යටවීමට බාධක ඉදිකිරීම සහ වෙනත් හේතු බලපාන බව අවධාරණය කර තිබුණි. ෂීට් පයිල්ස් ඉවත් කිරීමෙන් පසු මණ්ඩලයේ තත්ත්ව පරීක්ෂණ වාර්තා මගින් ජලයට ලුණු ඇතුළත් වී ඇති බව පෙන්වයි. එබැවින්, ෂීට් පයිල්ස් ඉවත් කිරීමේ පිරිවැය ඵලදායී නොවිය. | තාක්ෂණික හේතුන් පිළිබඳ පැහැදිලි සාක්ෂි නොමැතිව ගොවීන්ගේ විරෝධතාවයක් හේතුවෙන් මාතර දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් පරිදි අඩි 40 ක් දිග ෂීට් පයිල්ස් ඉවත් කර ඇත.<br>එම අවස්ථාවේදීම මෙම ෂීට් පයිල්ස් ඉවත් කිරීමට මණ්ඩලය පැහැදිලි විරෝධයක් දක්වා ඇත. කෙසේ වෙතත්, අනෙකුත් පාර්ශවකරුවන් විසින් මණ්ඩලයේ විරෝධතා සැලකිල්ලට නොගෙන ස්ටීල් ෂීට් පයිල්ස් ඉවත් කිරීමට තීරණය කර තිබුණි.<br>එහි ප්‍රතිඵලයක් වශයෙන්, දිගුකාලීන බලපෑම සලකා බැලීමේදී | දරන ලද ව්‍යාපෘති පිරිවැය ඵලදායි කිරීම සඳහා විශේෂඥ මතයක් සහිතව ෂීට් පයිල්ස් ස්ථාපිත කළ යුතුය. |

මෙම ස්ටීල් ෂීට් පයිල්ස් ඉවත් කිරීම ඵලදායී නොවේ.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තියට අනුව, නව සම්බන්ධතාවයේ දින සිට දින 30 ක් ඇතුළත පළමු බිල්පත පාරිභෝගිකයා වෙත නිකුත් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 මාර්තු 30 වැනි දිනට අවස්ථා 129 කදී කෝට්ටේ-කොලොන්නාව, කොළඹ දකුණ, කලුතර-මොරන්තුඩුව සහ මහරගම-කැස්බෑව යන ප්‍රදේශවල පළමු බිල්පත භාරදීමේදී දින 89 සිට දින 160 දක්වා වූ පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | මෙම ප්‍රදේශවලට නව ජල සම්බන්ධතා ලබාදීම සඳහා සේවා කොන්ත්‍රාත්තුවක් ලබාදී ඇති අතර කොන්ත්‍රාත්කරුවන් ලබාදුන් තොරතුරු ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතව ඇති බව සොයාගෙන ඇත. කෙසේ වෙතත්, එවැනි ප්‍රමාදයකින් තොරව ජල සැපයුමෙන් දින 30 ක් ඇතුළත ජල බිල්පත් ලබාදීමට කටයුතු කරමින් සිටින අතර පසු විපරම් කටයුතු සිදු කරනු ඇත. | මණ්ඩලයේ පාරිභෝගික ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලට අනුකූල වන බවට සහතික වීම සහ අඛණ්ඩව සිදුවන එවැනි අසාර්ථකවීම් වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ශක්තිමත් කළ යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 වැනි දිනට යල්පැනගිය, ප්‍රයෝජනයට ගත නොහැකි සහ චලනය නොවන තොග පිළිවෙළින් රු. මිලියන 2.6 ක්, රු. මිලියන 173 ක් සහ රු. මිලියන 552 ක් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව පැවතුණු අතර තොග පමාවූ කාලය හඳුනා ගැනීමට වයස් විශ්ලේෂණ මණ්ඩලය විසින් ලබා දී නොතිබුණි.<br>. | ගබඩා කළමනාකරණ ක්‍රියා පටිපාටි අත්පොතට අනුව එම වත්කම් පිළිබඳ පශ්චාත් තොග සත්‍යාපනය කරනු ලබන අතර යෝජිත අයි.එම්.එස් වර්ධනයන්ගෙන් පසුව තොග වයස් විශ්ලේෂණය ලබා දෙනු ඇත. | ගබඩා කළමනාකරණ ක්‍රියාවලි අත්පොතෙහි දක්වා ඇති උපදෙස් අනුව එම අයිතම ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | වසර තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ පවතින රු. මිලියන 30 ක තොග හිඟය නිරවුල් කිරීමට මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට තොග හිඟය පිළිබඳ විස්තරාත්මක විමර්ශනයක් කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. | විමර්ශනය අනවශ්‍ය ලෙස ප්‍රමාද නොකළ යුතු අතර එම ප්‍රමාදය නිසා සිදුවන අලාභ වගකිවයුතු නිලධාරීන් විසින් දැරිය යුතුය. |
| (ඈ) | 2023 වර්ෂයේ භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව, රු. මිලියන 106 ක සමස්ත වටිනාකමකින් යුත් ගොඩනැගිලි, ව්‍යුහයන්, යටිතල පහසුකම්, පරිගණක හා වෙනත් උපකරණ, සමීක්ෂණ උපකරණ, ජංගම උපකරණ ආදිය හානි වී ඇති බව, භාවිතයෙන් ඉවත් කර ඇති බව සහ පිරිවැය මධ්‍යස්ථාන අටකට අදාළව කඩා ඉවත් කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම අයිතම අපහරණය කිරීමට සහ ඉවත් කිරීමට නිසි | පශ්චාත් ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීම සඳහා කමිටුව පත් කර ඇති අතර පශ්චාත් සත්‍යාපන වාර්තාවට අනුව හැකි ඉක්මනින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.<br>අදාළ අනුමැතිය සහිතව ඉතිරි වත්කම් ඉදිරියේදී අපහරණය කරනු ලැබේ. | චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුව භාවිතා කළ නොහැකි වත්කම් අපහරණය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඉ) | මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා මානව සම්පත්, සැපයුම් සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා අනුමත මෙහෙයුම් අත්පොත් මණ්ඩලය සතු නොවීය. තවද, විගණනය, ව්‍යාපෘති, භූගත ජලය හැසිරවීම, මලාපවහන, ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානයේ, කාර්යාල භාර නිළධාරී කාර්යාලයේ සහ කළමනාකරු කාර්යාලයේ සැලසුම් සහ මෙහෙයුම් ක්ෂේත්‍ර සඳහා පවතින මෙහෙයුම් අත්පොත් 1989 සිට යාවත්කාලීන කර නොතිබුණි. | මානව සම්පත් සහ අයි.ආර් දෙපාර්තමේන්තුව සඳහා අයි.එස්.ඕ ප්‍රමිත සහතිකය හඳුන්වාදීමේ ක්‍රියාවලිය සමඟ මෙහෙයුම් අත්පොත සකස් කරමින් පවතී. අනුමැතිය ලැබුණු පසු ඒවා විගණන අංශයට භාර දෙනු ලබන අතර මණ්ඩලය නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීමට අවශ්‍ය රජයේ නීති සහ රෙගුලාසි අනුගමනය කරයි. | මණ්ඩලයේ මෙහෙයුම් සුමට කිරීම සඳහා අත්පොත් යාවත්කාලීන කිරීම කඩිනම් කිරීම. |
| (ඊ) | හයිඩ්‍රේටඩ් ලයිම්, ඇලුමිනියම් සල්ෆේට්, බ්ලීචිං පවුඩර්, ක්ලෝරීන්, පොලි ඇලුමිනියම් ක්ලෝරයිඩ් වැනි පරිභෝජන ද්‍රව්‍ය සඳහා තොග මට්ටම් මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණි. පරිභෝජන ද්‍රව්‍යවල අවශ්‍යතා තක්සේරු කිරීමේදී, තොගවල ආයුකාලය හඳුනා නොගැනීම, නිර්වචනය නොකළ තොග මට්ටම් වැනි එම්.අයි.එස් පද්ධතියේ සීමාවන් ද බලපායි. එබැවින්, තීරණ ගැනීමේදී සමහර අවස්ථාවන්හිදී ද්‍රව්‍ය අවශ්‍යතා වැරදි ලෙස තක්සේරු කර ඇත. | ඉදිරියේදී මෙම ගැටලුව විසඳීමට කටයුතු කරනු ඇත. | මණ්ඩලයට වන අනවශ්‍ය වියදම් වලක්වා ගැනීම සඳහා තොග මට්ටම් ස්ථාපිත කිරීම සහ අරමුදල් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම. |
| (උ) | බාහිර වෛද්‍ය රක්ෂණ ඔප්පුව සඳහා දරන ලද පිරිවැයට අමතරව, වැටුප සමඟ එක් අයකුට රු. 10,000 ක දීමනාවක් ලබා දීම මගින් සේවකයකුගේ බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර සඳහා රු. මිලියන 83 ක් සහ අනෙකුත් කාණ්ඩ 6 ක ප්‍රතිකාර සඳහා ප්‍රතිපූරණය වෙනුවෙන් රු. මිලියන 13 ක් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් දරා තිබුණි. 2021 පෙබරවාරි 09 දිනැති මණ්ඩල තීරණය අංක 4252(සී) හි අවශ්‍යතාවයන්ට පටහැනිව මණ්ඩලය විසින් පිළිගත් බාහිර රක්ෂණ ක්‍රම දෙකෙන් මෙම වෛද්‍ය ප්‍රතිකාර කාණ්ඩ සඳහා හිමිකම් පෑම සඳහා වන වැඩිදුර කොන්දේසි ආවරණය නොවීය. කෙසේ වෙතත්, අභ්‍යන්තර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2021 වර්ෂයේදී සේවකයන් 8,843 ක් සඳහා දරන ලද රු. මිලියන 119.08 ක් වූ මුදලට සාපේක්ෂව වෛද්‍ය වියදම සියයට 118 කින් වැඩි කරමින් බාහිර යෝජනා ක්‍රමය යටතේ 2023 වර්ෂයේදී සේවකයන් 8,275 ක් සඳහා රු. මිලියන 259.50 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. | ලද ලංසු අනුව එක් පුද්ගලයෙකුට රු. 9,100 ක අමතර පිරිවැයක් මණ්ඩලය විසින් දැරිය යුතුය. එබැවින්, සුදුසු රක්ෂණ ක්‍රමයක් ලැබෙන තෙක් වාර්ෂිකව රු. 10,000 ක් වැටුප සමඟ ගෙවීමට මණ්ඩලය අනුමත කර තිබුණි. | මණ්ඩලය වියදම් ඵලදායී ලෙස කළමනාකරණය කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට දේශීය මිලදී ගැනීම් මත මාර්ගස්ථ තොගය සහ ආනයනික මාර්ගස්ථ තොගය පිළිවෙළින් රු. මිලියන 1,246 ක් සහ රු. මිලියන 4,827 ක් විය. එම තොග අතරින්, රු. මිලියන 642 ක් වූ දේශීය මිලදී ගැනීම් නිරවුල් කිරීමෙන් තොරව මාස තුනකට වැඩි කාලයක් තිස්සේ පැවතුණු අතර රු. මිලියන 3,070 ක් වූ ආනයනික මාර්ගස්ථ තොග නිරවුල් කිරීමෙන් තොරව වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ පැවතුණි. | ණයවර ලිපි මගින් ආනයනය කරන ලද තොග සඳහා සම්පූර්ණ පිරිවැය වෙන් කිරීම සඳහා මෙම ගිණුම් පාලන ගිණුම් ලෙස ක්‍රියා කරයි. සාමාන්‍යයෙන් එක් ණයවර ලිපියකට සම්පූර්ණ කළ යුතු තොග කිහිපයක් හෝ ලොට්ස් කිහිපයක් පවතී. සියලුම තොග සම්පූර්ණ කරන තුරු ණයවර ලිපි පාලන ගිණුම්වල ශේෂයන් නිරවුල් කළ නොහැක. | දිගුකාලීන මාර්ගස්ථ තොග ශේෂ විමර්ශනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල මාර්ගස්ථ තොග හඳුනාගැනීමේ නිරවද්‍යතාවය සහතික කිරීම. |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණය සඳහා වන සහන කාලයෙන් පසුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී එ.ජ.ඩො මිලියන 45 ක ණය වාරික හයක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, චීන සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇති ණයවලින් රු. මිලියන 16,836.51 ට සමාන එ.ජ.ඩො මිලියන 52 ක මුදලක් හෙවත් ණය මුදලින් සියයට 29 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන එස්ක්‍රො ගිණුමේ රඳවා ගෙන තිබුණි. | රටේ අතුරු ණය ප්‍රතිපත්තිය හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේ සිට අයි.පී.සී ගෙවීම් කොන්ත්‍රාත්කරු වෙත සිදු කර නොමැත. එස්ක්‍රො ගිණුමේ පවතින ඉතිරි අරමුදල් ලබා ගැනීම සඳහා සී.ඩී.බී සමඟ සාකච්ඡා කර ඇති අතර අයි.එම්.එෆ් සමඟ රජයේ සාකච්ඡා අවසන් කිරීමෙන් පසු හිතකර විසඳුමක් අපේක්ෂා කෙරේ. | ආවස්ථික පිරිවැය අවම කර ගැනීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් කඩිනම් කිරීම. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු .මිලියන 33 ක වියදමින් ඉදිකරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රම හතරක කාර්යාල නිල නිවාස 13 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අක්‍රියව පැවතුණි. | අවශ්‍ය පරිදි අලුත්වැඩියා කිරීමෙන් පසුව කාර්ය මණ්ඩල නිල නිවාස අනාගතයේදී භාවිතා කරනු ඇත. | නිලධාරීන්ගේ නිල නිවාස සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉගිනියාගල සහ වඩිනාගල සහ දමන ජල සම්පාදන යෝජනා ක්‍රමවලට අදාළව පිළිවෙලින් රු. මිලියන 5.5 ක් සහ රු. මිලියන 9 ක් වටිනා සියලුම ඉදිකිරීම් 2001 වර්ෂයේ සිට අක්‍රියව පැවති අතර එම වත්කම් | මේවා අතහැර දමා ඇති නමුත් අනාගතයේදී මේවා අනාගත භාවිතය සඳහා පුනරුත්ථාපනය කරනු ලැබේ. ඉඟිනියාගල ගිල්විය | වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු සම්පාදනය කිරීම. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හැකි පොම්පය මහඹය ඩබ්ලිව්.එස්.පී (එම්.ටී.එන් 16501) වෙත භාරදී ඇත. බෙදාහැරීමේ පද්ධතිය පරගහකැලේ ඩබ්ලිව්.එස්.එස් වෙත සම්බන්ධ කර ඇත. වැවේ සිට පැරණි ඉන්ටේක් ලයින් විකල්ප භාවිතයන් සඳහා වෙන් කර ඇත. | |

**3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩවල ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති දහහතරක් සහ දේශීය බැංකු අරමුදල් සපයන ව්‍යාපෘති පහක් සම්බන්ධයෙන්, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රමාදය, කොවිඩ් 19, ආර්ථික අර්බුදය යනාදිය හේතුවෙන් අවස්ථා 02 සිට 08 දක්වා වූ පරාසයක කාලය දීර්ඝ කිරීම් ලබා දීමෙන් පසුව පවා දින 498 සිට දින 2,510 දක්වා වූ පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය.<br>ඉහත අසාර්ථක වීම් හේතුවෙන්, 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයට සහ රජයට මිල ඉහළ යැම ලෙස රු. මිලියන 19,868 ක් අනාර්ථික ලෙස ගෙවීමට සිදු විය. ඊට අමතරව, ව්‍යාපෘති සඳහා බැඳීම් ගාස්තු, ප්‍රමාද ගාස්තු සහ විනිමය උච්චාවචනයන් මත පාඩු වැනි අනාර්ථික වියදම් දැරීමට සිදු විය. | කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව කොන්ත්‍රාත් කාලය තුළ යොදා ගනු ලබන මිල වැඩි කිරීමේ සූත්‍ර ඇති අතර කොන්ත්‍රාත්කරුට මිල වැඩි කිරීමක් ලබා ගැනීමට ගිවිසුම්ගත අයිතියක් ඇත. සියලුම මිල වැඩිකිරීම් අදාළ බලය දීම සහිතව සහ ගෙවීම් කොන්දේසි අනුගමනය කිරීම මගින් ගෙවා ඇත.<br>2023/02/07 දිනැති අංක සී.පී/23/0042/618/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සහ මුදල් අමාත්‍යවරයා විසින් ලබා දුන් 2023.01.25 දිනැති ඔහුගේ නිරීක්ෂණ අනුව කොන්ත්‍රාත්තුවේ මිල වැඩි කිරීමට අවසර දී නොමැති කොන්ත්‍රාත් සඳහා මිල වැඩි කිරීමට සලකා බැලීමට අවසර ඇත. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලට සෘජුවම බලපාන අසාමාන්‍ය තත්ත්වයක් නොමැති විට හැර මූලික ගිවිසුමේ කාලයට අනුව ව්‍යාපෘතිය නිම කිරීමට අධීක්ෂණය කළ යුතුය. |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයට ජල මීටර ප්‍රසම්පාදනය සඳහා අරමුදල් නියෝජිතායතනයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මහ කොළඹ ජල හා අපජල කළමණාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතියේ අරමුදල් හරහා බැදීම් ගාස්තු ලෙස අමතර රු. මිලියන 67 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. එබැවින්, එම කොන්ත්‍රාත්තු මගින් මිළදී ගත් ජල මීටරයේ මිල රු. | එවකට රටේ පැවති තත්ත්වය අනුව අඛණ්ඩ ජල සැපයුමක් ලබාදීමට සහ පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදයෙන් පසුව හා ආර්ථික අර්බුදය තුළදී එම අරමුණ ඉටු කිරීමට, ලංකා බැංකුවට ප්‍රමාණවත් ඩොලර් ද්‍රවශීලතාවයක් | විෂය පථයෙන් බැහැර ක්‍රියාකාරකම් සඳහා අරමුදල් නියෝජිතායතනයේ අනුමැතිය ලබා ගත යුතු අතර මණ්ඩලයට දැරීමට සිදුවන |

| | | | |
|---|---|---|---|
| | 720.98 කින් හෙවත් සියයට 12.93 කින් වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, ජල මීටර 44,701 ක් සහ 253,009 ක් පිළිවෙලින් 2022 සහ 2023 වසර අවසානයේදී තොගයේ පැවතුණි. | නොමැති බැවින් GCWWMIP ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන්ගේ ඩොලර් ගිණුම හරහා ණයවර ලිපි විවෘත කිරීමට ඉහළ කළමනාකාරිත්වය තීරණයක් ගෙන ඇත. | අනාර්ථික පිරිවැය වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.12 ඡේදයට අනුව ඵලදායි තරඟයක් නොමැතිකම හේතුවෙන් ලංසුව අවලංගු කළ යුතු වුවත්, එකම ලංසුකරු වූ ලංසුකරු වෙත රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව 2019 වර්ෂයේදී පිරිනමා තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් විවිධ හේතූන් මත පළමු සහ දෙවන දීර්ඝකිරීම් සඳහා පිළිවෙලින් රු. මිලියන 57 ක සහ රු. මිලියන 654 ක ප්‍රමාද ගාස්තු ඉල්ලා තිබුණු අතර ඉල්ලා සිටි මුදල 2024 මාර්තු 30 වන දින දක්වා ගෙවා නොතිබුණි. තවදුරටත් කොන්ත්‍රාත්කරු විසින් FIDIC මාර්ගෝපදේශයේ 14.7 සහ 14.8 ඡේද යටතේ බිල්පත් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් එ.ජ.ඩො 127,851 ක මුදලක් ඉල්ලා තිබුණි. තවද, විගණකගේ ගණනයට අනුව, ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් සම්ප්‍රේෂණ මාර්ග එලීමේ දිග කිලෝමීටර් 20.4 සිට කිලෝමීටර් 5.9 දක්වා අඩු වීම නිසා ව්‍යාපෘතිය මගින් රු. මිලියන 55 ක් වැඩිපුර ගෙවා තිබුණි. | රුවන්වැල්ල ඩබ්ලිව්.එස්.පී සඳහා ශක්‍යතා වාර්තාව 2012 දී අවසන් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සැලසුම් දිගන්තය (Design Horizon) 2030 සිට 2040 දක්වා ගැලපීමේ අවශ්‍යතාවයක් ඇති විය. 2012 සහ 2015 අතර කාලයේදී, ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ශක්‍යතා විශ්ලේෂණයෙන් වසර තුනකට පසුව ආරම්භ කිරීම නිසා සැලසුම් දිගන්තය වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. මණ්ඩලය 2015 දී සැලසුම් විෂය පථය වෙනස් කළේ නම්, එය ප්‍රසම්පාදනය තවදුරටත් ප්‍රමාද වීමට හේතු වනු ඇත. එම නිසා, ව්‍යාපෘතියේ කළමනාකාරිත්වය සහ මණ්ඩලය විසින් ව්‍යාපෘති ආරම්භයෙන් පසුව අවශ්‍ය ගැලපීම් සිදු කර ඇත. රු. මිලියන 81.98 ක් වූ මෙම විචලනය හේතුවෙන් කාලය දීර්ඝ කිරීමේ පිරිවැයෙහි බලපෑම, විචල්‍ය නියෝගය සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව කොන්ත්‍රාත්තුව තුළ ඇති කොන්ත්‍රාත් අවිනිශ්චිතතා මගින් ආවරණය වී ඇත. | හොඳම මිලට කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය ඉලක්ක ගත කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් අංක Sup&MM/chem/HL-01/2021/22 යටතේ වන ලංසු ලියකියවිලිවල ඇමුණුම් 12 අවශ්‍යතාවය ප්‍රකාරව පූර්ව සුදුසුකම් සපුරා නොමැති කොන්ත්‍රාත්කරු වෙත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ඇස්තමේන්තුගත මිල සමඟ රු. මිලියන 49.37 ක අවාසිදායක විචලනයක් සහිත හයිඩ්‍රේටඩ් ලයිම් මෙට්‍රික් ටොන් 2500 ක් ප්‍රසම්පාදනය කිරීමට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | මුලදී අඩුම ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත්කරු පරාමිති මැංගනීස් අන්තර්ගතය සඳහා නිදහස් කිරීමක් ඉල්ලා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලද අතර, තොග හිඟ තත්ත්වය, කොන්ත්‍රාත් ගිවිසුම සඳහා ගතවන කාලය, ණයවර ලිපි | තීරණ ගැනීමේදී පිරිවැය සලකා බැලිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විවෘත කිරීමේ ප්‍රමාදයන්, නිෂ්පාදනය හා නැව්ගත කිරීමේ කාලය සහ විශේෂ කමිටු නිර්දේශ සැලකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ඊළඟ ලංසුකරුවා සලකා බලන ලදී. | |
| (ඇ) | ජල මීටර් ප්‍රසම්පාදනය කිරීමේදී, කොන්ත්‍රාත් අංක DGM/M&E/WM/15/2021/09 යටතේ ආර්ථික අර්බුදය පැවති අවස්ථාවේදී ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාද වූ කාලය තුළදී රුපියලේ අගය අවප්‍රමාණය වීම සඳහා රු. මිලියන 48.97 ක් ගෙවා තිබුණි. තවද, තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තුගත වටිනාකම වූ රු. මිලියන 83.58 හා සසඳන විට රු. මිලියන 167.39 ක් වැය කර තිබුණි. | එවකට රටේ පැවති තත්ත්වය අනුව අඛණ්ඩ ජල සැපයුමක් ලබාදීමට සහ පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදයෙන් පසුව හා ආර්ථික අර්බුදය තුළදී එම අරමුණ ඉටු කිරීමට, ලංකා බැංකුවට ප්‍රමාණවත් ඩොලර් ද්‍රවශීලතාවයක් නොමැති බැවින් GCWWMIP ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන්ගේ ඩොලර් ගිණුම හරහා ණයවර ලිපි විවෘත කිරීමට ඉහළ කළමනාකාරීත්වය තීරණයක් ගෙන ඇත. | තීරණ ගැනීමේදී පිරිවැය සලකා බැලිය යුතුය |

**3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කද්දුව පොම්පාගාරය සඳහා රු. මිලියන 45.93 කට මිළදී ගත් පොම්ප හතරක් ආරම්භයේ සිටම නිසි පරිදි ක්‍රියාත්මක නොවීය. දෝෂ වගකීම් කාලය තුළදී එම දෝෂ නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරු යොමු නොවීම නිසා හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා මණ්ඩලය විසින් මණ්ඩලයේ මුදල් වැය කර තිබුණි. කෙසේ වෙතත්, දෝෂ වගකීම් කාලය 2022 අප්‍රේල් 22 දිනෙන් අවසන් වන විටත් දෝෂ නිවැරදි කිරීම සඳහා මණ්ඩලය විසින් දරන ලද පිරිවැය අයකර ගැනීමට සහ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකිරීමට එරෙහිව ක්‍රියා කිරීමට මණ්ඩලය විසින් ක්‍රියා කර නොතිබුණි. | දෝෂ නිවැරදි කිරීම සඳහා දරන ලද පිරිවැය අයකර ගැනීමට මණ්ඩලය ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්, අලාභ සඳහා වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් ගෙවා නොමැත. | මණ්ඩලය විසින් දරන ලද පිරිවැය සහ කිසියම් දෝෂයක් රඳවා ගත් මුදල් හා කාර්ය සාධන බැඳුම්කරය හරහා ආවරණය කර ගත යුතුය. |
| (ආ) | ඉතිරි වැඩ අවසන් කිරීමට අපොහොසත් වූ කොන්ත්‍රාත්කරුට එරෙහිව පියවර ගැනීමෙන් තොරව මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපාය කිරීම සහ වේගවත් කිරීම පිළිබඳ | මාතර අදියර IV ඩබ්ලිව්.එස්.පී ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී | අනවශ්‍ය ප්‍රමාදයන් සහ මණ්ඩලයට සිදුවන පිරිවැය වළක්වා ගැනීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | කමිටුවේ නිර්දේශ අනුව මණ්ඩලය විසින් මාතර අදියර IV ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කර තිබුණි. ඉඩම අත්පත් කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය යටතේ මණ්ඩලය විසින් ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 72.7 ක් හා ඇ.ඩො. මිලියන 2.1 ක් ගෙවා තිබුණි. ගනු ලැබූ අවිධිමත් තීරණ හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වීම මත විනිමය අනුපාත වෙනස්කම් ලෙස තවත් රු. මිලියන 1,715 ක් ගෙවා තිබුණි. තවද, ව්‍යාපෘති කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් සේවකයින් සඳහා රු. මිලියන 30 ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවා තිබුණි. | ඇත.<br>ඉඩම් හිමිකරු මණ්ඩලයට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනු කරන ලද අතර රටේ පැවති කොවිඩ් 19 වසංගතය සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. මෙහෙයුම් සහ නඩත්තු කටයුතු අත්‍යවශ්‍ය කාර්යයන් වන බැවින් මෙම කාර්යයන් දැනට සිටින කාර්ය මණ්ඩලය සමඟ සිදු කළ නොහැක. | කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමට පෙර ඉඩම නිරවුල් කර ගැනීම. |
| (ඇ) | 2023 මැයි 28 දිනට මූල්‍ය අවසන් කිරීමේ කාලසීමාව අවසන් වී ඇතත් මහනුවර උතුර - පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම දායකයා (Donor) විසින් ලබා දී නොතිබුණි. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 88 ක් වූ අතර කොන්ත්‍රාත්තුවේ හිඟ වටිනාකම රු. බිලියන 12 ක් විය. විදුලි සම්බන්ධතා ගාස්තු රු. මිලියන 102 ක් නොගෙවීම හේතුවෙන් පොම්පාගාරය සහ සේවා ටැංකි 25 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එ.ජ.ඩො 8,840,917 කට මිළදී ගෙන සවි කර ඇති පොම්ප 16 ක් සහ ජනක යන්ත්‍ර 6 ක් භාවිත කර නොතිබුණි. ව්‍යාපෘතිය මගින් තොග මීටර 15 ක් සහ වැල්වයන් 132 ක් සවි කිරීමට සැලසුම් කර තිබුණද තොග මීටර් 15 ක් පමණක් සවි කර තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට නොගෙවීම හේතුවෙන් තීරණාත්මක වැඩ නිම කිරීම ප්‍රමාද වීමෙන් ජනන යන්ත්‍ර සහ පොම්ප යන දෙකෙහිම පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වී ඇත.<br>සඳහන් කර ඇති වැල්වයන් ආනයනය කර ව්‍යාපෘතියට සපයා ඇති බැවින් මූල්‍ය ගැටලුවකට මුහුණ පෑමට සිදුව ඇත. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අරමුදල් සැපයිය යුතුය. |
| (ඈ) | 2020 මැයි 14 දිනැති මුලික නිම කිරීමේ දින සිට දින දීර්ඝ කිරීම් 08 ක් ලබා දී තිබියදීත්, අලුත්ගම, මතුගම, සහ අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සියයට 95.34 ක ප්‍රගතියක් පමණක් ළඟා කරගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ස්ථාපනය කරන ලද නව පොම්පය ඉහළ කම්පන සහ ස්ථාපනය කිරීමේ ගැටලු මත ක්‍රියාකාරී තත්ත්වයක නොමැති වීම හේතුවෙන් පැරණි තුළුමුවෙහි මෙහෙයුම් නවතා තිබුණි. නව පොම්පය ක්‍රියා විරහිත වීම හේතුවෙන්, මණ්ඩලය විසින් ජලය කොලේමෝදර නව තුළුමුවේ සිට කිලෝමීටර් 15.5 ක් දුරින් පිහිටි කෙත්හේන පවිත්‍රාගාරයට පොම්ප කර ඇත. මේ හේතුවෙන්, පැරණි තුළුමුවෙහි අක්‍රීය කාලසීමාව තුළ මණ්ඩලයට රු. මිලියන 106 ක අමතර විදුලි පිරිවැයක් දැරීමට සිදු විය. | විවිධ පාලනය කළ නොහැකි හේතූන් මත කොන්ත්‍රාත්කරුට දීර්ඝ කිරීම් 08 ක් ලබා දී ඇත.<br>දැනට, කොන්ත්‍රාත්කරු කම්පනයට හේතු සොයා බලමින් සිටින අතර අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු හේතුවෙන් මණ්ඩලය විසින් දරන ලද අනවශ්‍ය වියදම් සඳහා හිමිකම් පෑම සහ දෝෂ වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරුගේ අඩුපාඩු නිවැරදි කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිය 08 ට පටහැනිව කොන්ත්‍රාත් ගිවිසුම යටතේ රු. මිලියන 19 ක් වටිනා සපයා ඇති සහ බෙදාහැර ඇති ඩීඅයි නළවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද ද්‍රව්‍ය තත්ත්ව පරීක්ෂණ වාර්තාව මත මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත්, භෞතික පරීක්‍ෂණයේ දී ඩීඅයි නළ 95 න් ඩීඅයි නළ 10 ක සම්බන්ධක (DI planges) වල ජලය කාන්දු වීම හේතුවෙන් ඩීඅයි නළවල පිළිගත හැකි මට්ටමේ ගුණාත්මකභාවයක් නොමැති බව විගණන පරීක්‍ෂණයේදී අනාවරණය විය. | සපයනු ලබන භාණ්ඩවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම අදාළ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. අදාළ පයිප්ප පරීක්ෂා කරනු ලබන අතර, මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි එය ප්‍රමාණ පරීක්ෂණයක් පමණක් නොවේ. | සැපයුම ලද අවස්ථාවේ ද්‍රව්‍ය තත්ත්ව පරීක්ෂා කිරීමට වඩා ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට ක්‍රියා පටිපාටිය සකස් කළ යුතුය. |
| (ඊ) | “සැමට ජලය” ව්‍යාපෘති සඳහා ආරම්භයේ දී ප්‍රසම්පාදන කමිටු විසින් මුදල් තිබෙන බව තහවුරු කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘති තොරතුරු පද්ධතිය මඟින් සපයන ලද තොරතුරුවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට සැලසුම් කළ ක්‍රියාකාරකම් 475 ක් අතරින් ක්‍රියාකාරකම් 106 කට අදාළව සියයට 6 ක් හෝ ඊට අඩු ප්‍රගතියක් පමණක් ළඟාකරගෙන තිබුණි . තවද, මෙම ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන ලද රු. මිලියන 5,198.89 ක් වටිනා HDPE නළ ප්‍රමාණයක් 2023 දෙසැම්බර් 31 දිනට නිසි කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් දිවයින පුරා අනාරක්ෂිත ලෙස තොගවල පැවතුණි. | එකඟ වේ. | අරමුදල් භාවිතා කිරීමට පෙර ප්‍රසම්පාදන කමිටුව විසින් ව්‍යාපෘතිවල ශක්‍යතා සහතික කළ යුතුය. |

### 3.9 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශය වෙත අවිධිමත් ලෙස මුදා හැර ඇති සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවූ රු. මිලියන 24.34 ක් ඇතුළුව රු. මිලියන 263.33 ක් මණ්ඩලය විසින් රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගත යුතුය. අයකර ගැනීමෙන් තොරව, 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ජනාධිපති කාර්යාලයට නිදහස් කළ සේවකයාගේ වැටුප් ලෙස රු. මිලියන 5 ක් ගෙවා තිබුණි. තවද, 2022 ජූලි 22 දින සිට වැටුප් ගෙවීමකින් තොරව අගමැති කාර්යාලයට එක් සේවකයෙකු නිදහස් කර තිබුණි.<br>තවද, රු. මිලියන 66.47 ක් වටිනා වාහන 6 ක් රේඛීය අමාත්‍යාංශයට නිදහස් කර තිබූ අතර ඉන් රු. මිලියන 39.26 ක් වටිනා එක් වාහනයක් ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයකට නොගෙන රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ | රේඛීය අමාත්‍යාංශයෙන් ලද ඉල්ලීම් අනුව, සේවකයින් නිදහස් කර ඇත. නිදහස් කරන සේවකයන්ට ගෙවන වැටුප ප්‍රතිපූරණය කරන ලෙස සෑම මාසයකදීම රේඛීය අමාත්‍යාංශයට ඉල්ලීම් යවනු ලබයි.<br>මෙම මුදල ක්‍රමානුකූලව මුදාහරින බව අමාත්‍යාංශය දන්වා ඇත. රේඛීය අමාත්‍යාංශය විසින් මණ්ඩලය වෙත ප්‍රතිපූරණය නොකරන බැවින්, සමහර සේවකයින් නැවත මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇත.<br>එම වාහන නැවත මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. | මෙහෙයුම් අත්පොතෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වීම. |

ලේකම්වරයා විසින් 2019 වර්ෂයේ ආනයනය කළ අවස්ථාවේ සිට භාවිත කර තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, 2023 දෙසැම්බර් 31 වැනි දිනට සේවක හිඟය 2,625 ක් සහ සේවක අතිරික්තය 104 ක් වූ අතර තනතුරු 21 ක් සම්පූර්ණයෙන්ම පුරප්පාඩු විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ කාර්යමණ්ඩල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කාර්යමණ්ඩල අවශ්‍යතා මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි. | වත්මන් අවශ්‍යතාවලට සරිලන පරිදි කාර්ය මණ්ඩල සැලැස්ම යාවත්කාලීන කර අවශ්‍ය කාර්ය මණ්ඩලය වැඩි කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇතත් මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. තවද, මේ වන විට රජයේ බඳවා ගැනීම් නතර කර ඇති බැවින්, සේවකයන් අවශ්‍ය වුවද බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. | සේවක සංඛ්‍යාව පිළිබඳ නිසි ඇගයීමකින් පසුව මණ්ඩලයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හෝ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය සහ 2023 ජනවාරි සිට බලාත්මක එහි සංශෝධනවල ඡේද අංක 2.2.7 සහ 07 ට පටහැනිව මාතර අදියර IV ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන් එකොළොස් දෙනෙකු මණ්ඩලයේ රාජකාරි සඳහා මණ්ඩලය විසින් අනුයුක්ත කර ගෙවීම් කර තිබුණි. | මණ්ඩලය විසින් මෙහෙයුම් සහ නඩත්තු ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය යොදවා ඇත. ව්‍යාපෘති කාර්ය මණ්ඩල සමාජිකයින් 11 දෙනෙකු ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇත. මෙහෙයුම් සහ නඩත්තු කටයුතු අත්‍යවශ්‍ය කාර්යයන් වන බැවින් මෙම කාර්යයන් දැනට සිටින කාර්ය මණ්ඩලය සමඟ සිදු කළ නොහැක. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) | ස්ථාන මාරු ප්‍රතිපත්තියේ අවශ්‍යතාවලට මණ්ඩලය අනුකූල නොවූ අතර සිදු කරන ලද නියැදි පරීක්ෂණය අනුව, බස්නාහිර දකුණු ප්‍රදේශයේ සේවකයන් 591 දෙනාගෙන් සේවකයන් 273 දෙනෙක් වසර 05 ක අවශ්‍යතාවයට පටහැනිව අවුරුදු 07 සිට අවුරුදු 38 දක්වා එකම ස්ථානයක සේවය කරයි. තවද, එක් එක් සහ සෑම සේවකයෙකු සඳහාම මානව සම්පත් අංශය විසින් නිසි දත්ත පද්ධතියක් පවත්වා ගෙන නොතිබුණි. | කාර්ය සාධක බලකාය විසින් අනිවාර්ය ස්ථාන මාරු සලකා බැලීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, එම වැඩසටහන නුදුරේදීම ක්‍රියාත්මක කිරීමට නියමිත වේ. | සේවකයින්ගේ ප්‍රතිලාභ වෙනුවෙන් සේවකයින් මාරු කිරීම සඳහා දත්ත පදනමක් කඩිනමින් සකස් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විමර්ශන නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් 2022 ජනවාරි සිට 2023 අගෝස්තු දක්වා විමර්ශන ඒකකයට සේවකයින්ගෙන් ලද පැමිණිලි 144 ක් අතරින් පැමිණිලි 49 ක් පමණක් විසඳා ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව 2023.09.15 දින පැවරුම් පදනම මත විමර්ශන නිලධාරීන් 10 දෙනෙකු පත් කර ඇත. ඒ අනුව, 2022 ජනවාරි සිට 2023 අගෝස්තු දක්වා, මේ දක්වා ලැබී ඇති පැමිණිලි අතරින් පැමිණිලි 137 ක් මූලික කටයුතු සඳහා යොමු කර ඇත. එම පැමිණිලි අතරින්, 102 ක් මේ වන විට අවසන් කර ඇත. | සේවකයින් අතර විශ්වාසය වර්ධනය කිරීම සඳහා විසඳුම් ක්‍රියා පටිපාටිය කඩිනම් කිරීම. |

## 3.11 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් අපහරණය කළ වාහන 196 ක් තවමත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචි කළ වාහන 23 ක් හඳුනාගත නොහැක. | පැවරුම්ලාභියාගේ විස්තර සහිතව හිමිකම වෙනස් කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත සහ වාහනවල විස්තර ලබාදීම සඳහා ප්‍රාදේශීය සහාය මධ්‍යස්ථාන වෙත ලිපි යවා ඇත. | අනවශ්‍ය බැඳීම් සහ වංචා වළක්වා ගැනීම සඳහා මෙම කාරණය සම්බන්ධයෙන් කඩිනමින් පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 ගිණුම්කටයුතුභාවය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතියේ 05 (04) වගන්තියේ අවශ්‍යතා අනුව, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් වක්‍ර සම්බන්ධතාවයක් සභාපති විසින් හෙළි කර නොතිබියදීත් මණ්ඩලයේ සභාපතිවරයා සභාපතිත්වය දැරූ ප්‍රසම්පාදන කමිටුව මඟින් සූර්ය පද්ධතියක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 73 ක කොන්ත්‍රාත් වටිනාකමකට මණ්ඩලයේ සභාපතිවරයාට සෘජු සම්බන්ධතාවයක් ඇති සමාගමකට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට තීරණයක් ගෙන තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව තරඟකාරී ලංසු තැබීමේ පටිපාටිය අනුගමනය කර ඇත. | මණ්ඩලය සමඟ වන කිසියම් සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයන් හෙළිදරව් කිරීම. |

## 4.2 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020-2025 සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව, ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ "සැමට ජලය" සංකල්පය සමඟ ඒකාබද්ධව වර්ෂය සඳහා නව සම්බන්ධතා ඉලක්කයක් ස්ථාපිත කර ඇති අතර පසුව එම ඉලක්කය වසර තුළදී 160,000 දක්වා සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත්, වර්ෂය තුළදී නව සම්බන්ධතා 115,509 ක් ලබා දී ඇත. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව නව සම්බන්ධතා සංඛ්‍යාව සියයට 24.61 කින් අඩු වී ඇතත් මනුගත අලෙවි ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 77 කින් වැඩි වී ඇත. 2023 සැප්තැම්බර් 01 වැනි දින ජල ගාස්තු ඉහළ නැංවීම විකුණුම් වර්ධනයට ප්‍රධාන හේතුව විය. 2023 වර්ෂය සඳහා ආදායම් නොවන ජලය සඳහා ස්ථාපිත 23.91 ක ඉලක්කගත ප්‍රතිශතයට සාපේක්ෂව 25.32 ක ප්‍රතිශතයක් ලබාගෙන ඇති අතර දකුණු සහ මධ්‍යම ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානවල ආදායම් නොවන ජල ප්‍රතිශතය සමාලෝචිත වර්ෂය තුළදී සියයට 30 ට වඩා වැඩි විය. | ආර්ථික අර්බුදය හේතුවෙන් බලාත්මක කරන ලද රජයේ ප්‍රසම්පාදන සීමා කිරීම් සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසුව අධික මිල ඉහළ යාම හේතුවෙන් 2023 වර්ෂය සඳහා ඉලක්කගත සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකි විය. අප විසින් 2015 සිට 2022 දක්වා අපගේ නව සම්බන්ධතාවල ස්ථාවර වර්ධන ඉලක්කයක් පවත්වා ගෙන ගිය අතර, සාමාන්‍යයෙන් වසරකට සම්බන්ධතා 136,000 ක් ලබා දී ඇත. අභියෝග මධ්‍යයේ වුවද, 2023 දී සම්බන්ධතා 115,500 ක් එකතු කිරීමත් සමඟ අපගේ කාර්ය සාධනය ස්ථාවරව පැවතුණි. අපගේ ස්ථාපිත වර්ධන රටාවෙන් සැලකිය යුතු විචලනයකින් තොරව අත්‍යවශ්‍ය සේවා සැපයීමේදී බාධාවකින් තොරව ව්‍යාප්ත කිරීමට අපගේ කැපවීම මෙම අඛණ්ඩතාව අවධාරනය කරයි. | සංවිධානය නිවැරදි මාර්ගයට යොමු කිරීම සඳහා ළඟා කර ගත හැකි ඉලක්ක ස්ථාපිත කළ යුතුය. |

## 4.3 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායක සභාපති සහ අධ්‍යක්ෂවරුන් සඳහා යහපාලනය පිළිබඳ අත්පොතේ 4.4.1 හි අවශ්‍යතාවයට අනුව අධ්‍යක්ෂවරුන් ස්වාධීන විය යුතු වුවත්, මණ්ඩලයේ හිටපු සාමාන්‍යාධිකාරීවරයා 2023 ඔක්තෝම්බර් මාසයේ සිට විශ්‍රාම ගැනීමෙන් පසුව පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු සහ විගණන කමිටු සාමාජිකයෙකු ලෙස පත් කර තිබුණි. කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. 2023 වර්ෂය තුළදී රු. මිලියන 6.25 ක විශ්‍රාම ප්‍රතිලාභ ඇයට ලබා දී තිබුණි. | මෙම සාමාජිකයා විගණන කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු අංක 06 ට (SDG) අනුකූලව, වසර 2025 වන විට සියයට 100 ක නල ජල ආවරණය සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්ම සකස් කර තිබුණි. මෙම අරමුණ සපුරා ගැනීම සඳහා මණ්ඩලය විසින් ඉලක්ක 08 ක් සහ දර්ශක 08 ක් හඳුනාගෙන තිබූ අතර මෙම ඉලක්ක අතරින් ජල අංශයේ නීතිමය රාමුව සවිබල ගැන්වීම, ගෘහ හා ගෘහස්ථ නොවන නල ජල ආවරණය 313,217 කින් වැඩි කිරීම සහ නල අපවහන ආවරණය 867 කින් වැඩි කිරීම යන ඉලක්ක සමාලෝචිත වර්ෂය තුළදී සියයට 100 කින් ලඟා කර ගැනීමට මණ්ඩලය අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 වන දිනට ජල අංශයේ නෛතික රාමුව සවිබල ගැන්වීම සියයට 60 ක්, ජල සම්බන්ධතා 187,339 ක් සහ මලාපවහන සම්බන්ධතා 338 ක් පමණක් ලඟා කරගෙන තිබුණි. | 2020-2025 සඳහා වූ ආයතනික සැලැස්ම, "සැමට ජලය" වැඩසටහන මත මුලින් ගොඩනඟන ලද අතර, පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් බාධා කිරීම්වලට මුහුණ දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ඩබ්ලිව්.එෆ්.ඒ වැඩසටහනේ විෂය පථය ප්‍රමාණයෙන් අඩු වූ අතර 2025 වන විට ධාරිතාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පවතින ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රශස්ත කිරීම කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් ධාරිතා වැඩිදියුණු කිරීමේ සහ බෙදාහැරීමේ ව්‍යාප්ති (සී.ඊ.ඩී.ඊ) ව්‍යාපෘති වෙත ප්‍රමුඛතාවය යොමු කර ඇත. | එකඟ වූ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |